# වාර්ෂික වාර්තාව

# 2015

**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**

## දැක්ම

ළමුන් සඳහා ළමා හිතකාමී සහ සුරක්ෂිත පරිසරයක් ගොඩනැගීම

## මෙහෙවර

ළමුන් සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් නිදහස් බව තහවුරු කිරීම

## 2015 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය

| | |
|---|---|
| නීතිඥඅනෝමා දිසානායක මහත්මිය<br>2015.01.08 | සභාපති,<br>ජාතික ළමා ආරක්ෂක අධිකාරිය,<br>අංක.330, තලවතුගොඩ පාර,<br>මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර |
| නීතිඥසුජාතා කුලතුංග මහත්මිය<br>2015.01.08 | නියෝජ්‍ය සභාපති,<br>ජාතික ළමා ආරක්ෂක අධිකාරිය,<br>අංක.330, තලවතුගොඩ පාර,<br>මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර |
| ආචාර්ය නටාෂා බාලේන්ද්‍ර මහත්මිය<br>2015.02.12 | සභාපති,<br>ජාතික ළමා ආරක්ෂක අධිකාරිය,<br>අංක.330, තලවතුගොඩ පාර,<br>මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර |
| නීතිඥ සජීව සමරනායක මහතා<br>2015.02.12 | නියෝජ්‍ය සභාපති,<br>ජාතික ළමා ආරක්ෂක අධිකාරිය,<br>අංක.330, තලවතුගොඩ පාර,<br>මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර |
| මහාචාර්ය සමුද්‍රා කත්‍රිආරච්චි මහත්මිය<br><br>වෛද්‍යඑස්. පී. කඳපොල ආරච්චිගේ මහතා<br>(2015 මාර්තු මස සිට) | මනෝ වෛද්‍ය විශේෂඥ,<br>මනෝ වෛද්‍ය ඒකකය,<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,<br>නුගේගොඩ<br><br>මනෝ වෛද්‍ය විශේෂඥ,<br>මූලික රෝහල,<br>ගම්පහ |
| මහාචාර්ය මනෝරි සේනානායක මහත්මිය<br><br>වෛද්‍ය එල්. ඩී. සිල්වා මහත්මිය<br>(2015 මාර්තු මස සිට) | ජ්‍යෙෂ්ඨ ළමා රෝග විශේෂඥ,<br>වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය,<br>කොළඹ 07<br><br>ළමා රෝග විශේෂඥ,<br>දකුණු කොළඹ ශික්ෂණ රෝහල,<br>ගම්පහ |
| වෛද්‍ය පී. බී. දසනායක මහතා<br><br>වෛද්‍ය යූ.ඒ.කේ. තෙන්නකෝන් මහතා<br>(2015 මාර්තු මස සිට) | අධිකරණ වෛද්‍ය නිලධාරි,<br>විෂ වේදය හා නීති වෛද්‍ය ආයතනය,<br>අංක.111, ෆ්‍රැන්සිස් පාර,<br>කොළඹ 10 |
| ආචාර්ය ටී. ස්වින්ද්‍රන් මහතා | මනෝවිද්‍යාඥ,<br>අංක.6, පෙරේරා මාවත<br>කොළඹ 10 |
| කේ. වෛද්‍යරත්න මහතා | අතිරේක සොලිසිටර් ජෙනරාල්<br>නීතිපති දෙපාර්තමේන්තුව,<br>කොළඹ 12 |

| | |
|---|---|
| එම්. යමුනා පෙරේරා මහත්මිය | කොමසාරිස්,<br>පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව,<br>II වන අදියර, සෙත්සිරිපාය<br>බත්තරමුල්ල |
| හේරත් යාපා මහතා<br><br>චාන්දනී අමරතුංග මහත්මිය<br>(2015 මාර්තු මස සිට) | කම්කරු කොමසාරිස් ජෙනරාල්,<br>කම්කරු දෙපාර්තමේන්තුව,<br>කොළඹ 05 |
| ආර්. කේ. ජී. ඩී. විජේසිංහ මහත්මිය | අධ්‍යක්ෂ,<br>කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව,<br>මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය,<br>මහ ලේකම් කාර්යාලය,<br>කොළඹ 01 |
| ශිරෝමි මාසකෝරාල මහත්මිය<br><br>සිරිවර්ධනදහනායක මහතා<br>(2015 - නොවැම්බර් මස සිට) | සාමාජික,<br>අංක.4/10, වැලිකඩ වත්ත,<br>රාජගිරිය<br><br>අංක.3280,<br>අදියර III,<br>අනුරාධපුරය |
| බී. එම්. අබේකෝන් මහත්මිය<br><br>ආර්.බී. අබේසිංහ මහතා<br>(2015 - නොවැම්බර් මස සිට) | සාමාජික,<br>අංක.304, බෞද්ධාලෝක මාවත,<br>කොළඹ 07<br><br>අංක.621/4,<br>ගොඩගේ මාවත,<br>අනුරාධපුරය |
| ඒ.ආර්. වෛද්‍යාලංකාර මහතා<br><br>එම්. ආර්. ලතීෆ් මහතා<br>(2015 මාර්තු මස සිට) | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති,<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය,<br>පොලිස් මූලස්ථානය,<br>කොළඹ 01 |
| ඩී. එස්. විජේසේකර මහත්මිය<br>(2015.11.17 නොවැම්බර් සිට) | අතිරේක ලේකම්,<br>කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය,<br>අංක.175, ඒ නාවල පාර,<br>නුගේගොඩ |

## 2015 වසරේ ජාතිකළමා ආරක්ෂක අධිකාරියේ මූල මණ්ඩලය

| | |
|---|---|
| අනුෂා ඒ. මුණසිංහ මහත්මිය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,<br>අධිකරණ අමාත්‍යාංශය,<br>කොළඹ 12 |
| ආර්. එම්. අයි. රත්නායක මහත්මිය | අතිරේක ලේකම්,<br>රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය,<br>බාලදක්ෂ මාවත,<br>කොළඹ 03 |
| කේ. ඩබ්. ටී. එන්. අමරතුංග මහත්මිය | අතිරේක ලේකම්,<br>ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය,<br>අංක.163, කිරුළපන මාවත,<br>පොල්හේන්ගොඩ,<br>කොළඹ 05 |
| එම්. ඒ. එම්. අරිෆා මහත්මිය<br><br>මහදේව මහතා<br>(2015 මාර්තු මස සිට) | කොමසාරිස්,<br>කාන්තා හා ළමා කටයුතු අංශය,<br>කම්කරු දෙපාර්තමේන්තුව,<br>කොළඹ 05 |
| හේමා ධර්මවර්ධන මහත්මිය | අතිරේක ලේකම්,<br>ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,<br>අංක.464, ටී.බී. ජයා මාවත,<br>කොළඹ 10 |
| යූ. එස්. කේ. දෙනාවත්ත මහත්මිය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,<br>පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය,<br>අංක.330, යූනියන් පෙදෙස,<br>කොළඹ 02 |
| ඩී. එස්. විජේසේකර මහත්මිය<br>(2015 නොවැම්බර් මස) | අතිරේක ලේකම්,<br>කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය,<br>අංක.175, ඒ නාවල පාර,<br>නුගේගොඩ |
| කේ. වී. ඩී. සි. විමලසිරි මහතා | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන),<br>සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය,<br>අංක.385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,<br>කොළඹ 10 |
| එස්.ඒ.ඩී.එස්. සුහසිංහ මහත්මිය | අතිරේක ලේකම්,<br>සමාජ සේවා හා සමාජ සුබසාධන අමාත්‍යාංශය,<br>සෙත්සිරිපාය,<br>බත්තරමුල්ල |
| එච්. යූ ප්‍රේමතිලක මහතා | අතිරේක ලේකම්,<br>අධ්‍යාපන අමාත්‍යාංශය,<br>ඉසුරුපාය,<br>බත්තරමුල්ල |

| පටුන | පිටුව |
|---|---|
| හැඳින්වීම | 01-02 |
| ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්යභාරය සැකවින් | 02-03 |
| අධිකාරියේ ව්‍යුහය | 03 |
| 2015 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සංවිධාන ව්‍යුහය | 04 |
| 2015 ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය | 05 - 06 |
| **සංවර්ධන වැඩසටහන්** | |
| අන්තර්ජාලය හා දුරකථනය හරහා ළමුන්ට අනිසි බලපෑම් සිදුකරන පුද්ගලයින්ට එරෙහිව ක්‍රියාත්මක වීමට කාර්යසාධන බලකායක් පිහිටුවීම | 06 - 07 |
| සුනාමි ව්‍යසනය හේතුකොට ගෙන වින්දිත වූ  ළමුන් සඳහා පුනරුත්ථාපන කටයුතු හා සුබසාධන කටයුතු සිදුකිරීම | 07 |
| නිවාස ගත ළමුන් හදිසි අනතුරුවලින් වළක්වා ගැනීම සඳහා වැඩසටහනක් පැවැත්වීම | 07 |
| පාසල් ළමා ආරක්ෂක කමිටු | 07-08 |
| සිවිල් සංවිධාන සාමාජිකයන් දැනුවත් කිරීම | 08 |
| සෞඛ්‍ය වෘත්තිකයන් දැනුවත් කිරීම | 09-10 |
| ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු සිසුන් දැනුවත් කිරීම | 11 |
| ප්‍රංශ පොලීසිය විසින් සිදුකරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන | 12 |
| ළමා හිංසනයට එරෙහි ජාතික දිනය | 12-13 |
| ළමා ශ්‍රමිකත්වයට එරෙහි ජාත්‍යන්තර දිනය සැමරීම | 13-14 |
| ළමා ශ්‍රමිකත්වයට එරෙහි ජාත්‍යන්තර දිනය සැමරීමට සමගාමීව සමස්ත ලංකා මට්ටමින් ගද්‍ය රචනා තරඟයක් පැවැත්වීම | 14 |
| ලෝක ළමා දිනය සැමරීමේ ජාතික වැඩසටහන | 15 |
| ලෝක ළමා දිනයට සමගාමීව පාසල් ළමුන් සඳහා පෝස්ටර් තරඟයක් පැවැත්වීම | 15 |
| ලෝක ළමා දිනයට සමගාමීව "අන්තර්කරණ අධ්‍යාපනය හා ළමා ආරක්ෂණය පිළිබඳ" ප්‍රතිපත්තිමය සංවාදයක් පැවැත්වීම | 16 |
| ගැහැණු ළමයාගේ ජාත්‍යන්තර දිනය | 16-17 |
| තොරතුරු ලබාදීම | 17 |
| ප්‍රදර්ශන හා ජංගම සේවා පැවැත්වීම | 18 |
| ළමා ආරක්ෂාවට අදාළ තොරතුරු ජනමාධ්‍ය හරහා ජනතාව අතරට රැගෙනයාම | 18-19 |
| ළබැඳි පුවත් හසුන | 19 |
| 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවාව | 19-20 |
| ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි | 20-21 |
| නීතිමය කර්තව්‍යන් | 21-22 |
| ළමා අපයෝජන වින්දිතයන්ගේ සාක්ෂි වීඩියෝ පටිගත කිරීම | 22 |
| අන්තර්ජාල ආවේක්ෂණ ඒකකය ක්‍රියාත්මක කිරීම | 23 |

| | |
|---|---|
| විශේෂ පොලිස් විමර්ශන | 23 |
| මනෝ සමාජීය වැඩසටහන් | 23-24 |
| දිරිදරු සුරැකුම් පියස සම්පත් මධ්‍යස්ථාන | 24-25 |
| ළමා කේන්ද්‍රීය මධ්‍යස්ථාන | 25 |
| වර්ෂය අවසන් ආදායම් ප්‍රකාශය | 26 |
| 2015.12.31 දිනට මූල්‍යතත්ව ප්‍රකාශය | 27 |
| 2015.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 28 |
| විගණන වාර්තා | 29-41 |

**හැඳින්වීම**

අතීත ශ්‍රී ලාංකේය සමාජය තුළළමා ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කල බවක් එම සංස්කෘතිය අධ්‍යයනය කිරීම තුළින් මනාව නිරූපණය වේ. එකල ළමයාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් සමාජ ආරක්ෂණ ක්‍රමවේදයක් පැවතුණි. සමාජය නොයෙකුත් වෙනස්වීම්වලට ලක්වීමේ අයහපත් ප්‍රතිඵලයක් ලෙස ළමා අපයෝජන සිදු වීම සීඝ්‍රයෙන් වර්ධනීය අවස්ථාවකට ලක් විය. එය සමාජ ප්‍රශ්නයක් ලෙස නිරූපණය වීම වර්තමානය වන විට සිදුව ඇත. සමාජ ප්‍රශ්නයක ලක්ෂණයක් වන්නේ එය සමාජය තුළින්ම විසඳාගැනීමේ හැකියාව පැවතීමයි.

ළමා ආරක්ෂාව යන්න තහවුරු කිරීමේ අවදානම්කාරී තත්ත්වයට මුහුණදීමට අන්තර්ජාතික වශයෙන් එකඟතාවයක් අවශ්‍ය බව අවබෝධ විය.ඒ අනුව 1989 නොවැම්බර් 20 වන දින “එක්සත් ජාතින්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය” විශ්ව ප්‍රකාශනයක් ලෙස සම්මත කර ගන්නා ලදි. මෙම ප්‍රඥප්තිය වගන්ති 54 කින් සමන්විත වන අතර, එමගින් ලොව සෑම ළමයෙකුටම හිමි විය යුතු අයිතිවාසිකම් මෙන් ම එම අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමෙහිලා රාජ්‍ය සතු වගකීම ද විග්‍රහ කර තිබේ. ළමා අයිතිවාසිකම් සම්බන්ධයෙන් පවතින සමාජ තත්ත්වය විමර්ශනය කිරීමේ දී, ළමා වෙළඳාම, ළමා ගණිකා වෘත්තිය, ළමුන් කාමුක චිත්‍රපට සහ ප්‍රකාශන සඳහා යොදා ගැනීම අරමුණු කරගත්, ජාත්‍යන්තර රහස් වෙළඳාම ඉහළ යාම දැඩි ලෙස සැළකිලිමත් වෙමින් ද, ආයුධ සන්නද්ධ අරගලයන් හි දී ළමයින් බලහත්කාරයෙන් යුධ සේවාවෙහි යෙදවීම හෝ බඳවා ගැනීම අන්තර්ජාතික අපරාධයක් ලෙස දක්වමින් ද වර්ෂ 2000 දීළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය ට, ළමුන් සන්නද්ධ අරගලවලට බඳවා ගැනීම වැළැක්වීම සහ ළමා වෙළඳාම, ගණිකා වෘත්තිය සහ ළමයින් කාමුක චිත්‍රපට සඳහා යොදා ගැනීම වැළැක්වීම යන අතුරු කෙටුම්පත් ඇතුළත් කරන ලදි.

ලොව පැවති මෙම ප්‍රවනතාවයත් සමග ලංකා රජය ද එක්සත් ජාතින්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය සඳහා 1991 වසරේදී අත්සන් කොට තම එකඟතාවය පළ කරන ලදි. ඒ අනුව, ශ්‍රී ලංකාව තුළළමා අයිතීන් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම සම්බන්ධයෙන් 1996 වසරේ දෙසැම්බර් මස ළමා ආරක්ෂාව පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායක් පිහිටුවනු ලැබීය. එහි දී කරුණු විමර්ශනය කළ එම කමිටුව ළමා අපයෝජන අවම කිරීම සඳහා අධිකාරී බලතල සහිත රාජ්‍ය ආයතනයක අවශ්‍යතාවය සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කරන ලදි. ඒ අනුව 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනතින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ස්ථාපිත කරනු ලැබීය. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ආරම්භයේ සිට ම වර්තමානය දක්වා ම ළමා අපයෝජන වළක්වා ගැනීම, ළමා අපයෝජනයන් හි දී ඊට අදාල නිසි පියවර ගැනීම හා වින්දිත ළමුන් යළි සමාජගත කිරීමට අදාළ කටයුතු වෙනුවෙන් ක්‍රියා කරමින් සිටියි.

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනතේ බලතල භාවිතා කරමින් දැයේ ළමුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කරන අතර, 2004 දෙසැම්බර් මස 26 වැනි දින ඇති වූ සුනාමි ව්‍යසනය හේතුවෙන් වින්දිතභාවයට පත් ළමුන්ගේ අභිවෘද්ධිය සඳහා 2005 අංක 16 දරණ සුනාමි (විශේෂ විධිවිධාන) පනත මගින්ද අධිකාරිය වෙත බලතල හිමි ව පවතියි. තවද 2005 අංක 34 දරණ ගෘහස්ථ ප්‍රචණ්ඩක්‍රියා වැළැක්වීමේ පනත මගින් ළමයෙකු ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ලක් වූ විට අධිකාරියට වාර්තා වීමේදී තෙවන පාර්ශවකරුවෙකු වශයෙන් ඊට මැදිහත් විය හැකිය.

ළමයින්ගේ උපරිම යහපත වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා ළමා අපයෝජන සිදුවීම් කඩිනම්ව සහ විධිමත්ව වාර්තා කර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට 2010 ජූලි 22 වන දින "1929" ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය පැය 24 පුරාම ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරි පරිශ්‍රය තුළ ස්ථාපිත කරන ලදි. මෙම දුරකථන සේවය ආරම්භයත් සමග සමාජයේ සැඟව පැවති ළමා අපයෝජන වාර්තා වීම දක්නට ලැබුණි. අද වන විට ලංකාවේ සියලු ම දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි ළමා අපයෝජන වාර්තා වන අතර, උපදේශන සේවාවන් ද මෙමගින් ලබාගත හැකිය. වර්තමානය වන විට මෙම දුරකථන සේවය ජනතාව ට වඩාත් සමීප වෙමින් ක්‍රියාත්මක වේ.

## ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්යභාරය සැකවින්

- ළමා අපයෝජන වැළැක්වීම සහ එවැනි අපයෝජන වලට ගොදුරු වූ ළමුන් ආරක්ෂා කිරීම හා ඔවුන්ට ප්‍රතිකාර කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමෙහි ලා ආණ්ඩුවට උපදෙස් දීම.
- ළමා අපයෝජන වැළැක්වීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ආණ්ඩුවට උපදෙස් දීම.
- එවැනි අපයෝජන වලට ගොදුරුවූවන් ආරක්ෂා කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ආණ්ඩුවට උපදෙස් දීම.
- අපයෝජන වලින් ආරක්ෂා කරනු ලැබීමට ළමුන් සතු අයිතිවාසිකම් පිළිබඳ සහ ළමා අපයෝජන වැළැක්වීමේ ක්‍රම පිළිබඳව දැනුවත් කිරීම.
- ළමා අපයෝජන වැළැක්වීමේ කාර්යය සඳහා සහ එවැනි අපයෝජන වලට ගොදුරු වූවන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ අයිතීන් රැක ගැනීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීම සහ උචිත අවස්ථා වල දි එම කාර්යය සඳහා අදාළ අමාත්‍යාංශවල, පළාත් සභාවල, පළාත් පාලන ආයතනවල, දිසා හා ප්‍රාදේශිය ලේකම්වරුන්ගේ සහ රජයේ හා පෞද්ගලික අංශයේ සංවිධානවල උපදෙස් විමසීම.
- ළමා අපයෝජන වැළැක්වීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීතිමය, පරිපාලනමය හෝ වෙනත් සංශෝධන නිර්දේශ කිරීම.
- සියලු ආකාර ළමා අපයෝජනවලට අදාළ නීති ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීම.
- ළමා අපයෝජන හා සම්බන්ධ සියලු විමර්ශන හා අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය නියාමනය කිරීම.
- සන්නද්ධ ගැටුම්වල බලපෑම්වලට පාත්‍ර වූ ළමයින් සම්බන්ධව මානුෂිකව සැළකිල්ලට ගත යුතු කරුණු පිළිබඳව යොමු වීම සඳහා ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම හා ඔවුන්ගේ මානසික හා ශාරීරික සුහසිද්ධිය සඳහා පියවර ඇතුළුව එවැනි ළමුන්ගේ ආරක්ෂාව සහ ඔවුන් සමාජයට නැවත ඇතුලු කර ගැනීම.
- අපරාධ පිළිබඳ විමර්ශනවලට සහ අපරාධ නඩු කටයුතුවලට සම්බන්ධ ළමයින්ගේ ආරක්ෂාව හා රැකවරණය සඳහාඅවශ්‍ය අවස්ථාවලදී උචිත පියවර ගැනීම.
- ළමා අපයෝජන පිළිබඳව මහජන පැමිණිලි භාර ගැනීම සහ අවශ්‍ය අවස්ථාවලදි ඒ පැමිණිලි නිසි බලධාරින් වෙත යොමු කිරීම.ළමා අපයෝජනවලට එරෙහිව කරනු ලබන දැඩි

ව්‍යාපාරසම්බන්ධීකරණය සම්බන්ධයෙන් පළාත් සභාවලට, පළාත් පාලන ආයතනවලට හා රාජ්‍ය නොවන සංවිධානවලට උපදෙස් දීම හා සහය වීම.


- ළමා අපයෝජන සම්බන්ධව ජාතික දත්ත පදනමක් සකස් කිරීම සහ එය පවත්වා ගෙන යාම.
- අදාළ අමාත්‍යාංශ හා වෙනත් ආයතනයන්ගේ උපදෙස් විමසා ළමුන් සඳහා ළමා රැකවරණ සේවා සපයන සියලු ආගමික හා පුණ්‍ය ආයතන අධීක්ෂණය කිරීම හා ඒ පිළිබඳව නියාමනය කිරීම.
- ළමා අපයෝජන සහ ළමයින් ආරක්ෂා කිරීම හා සම්බන්ධ පර්යේෂණ පැවැත්වීම, ප්‍රවර්ධනය කිරීම හා සම්බන්ධීකරණය කිරීම.
- ළමයින්ගේ සුරක්ෂිතභාවය සහ ළමුන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ජනතාවට තොරතුරු සැපයීම සහ අධ්‍යාපනය ලබා දීම.
- ළමා අපයෝජනවලට ඇති ඉඩ ප්‍රස්ථා අවම කිරීම පිණිස, සංචාරක කටයුතු හා සම්බන්ධ සියලු අංශ සමග සංවාදයෙහි යෙදීම.
- ළමා අපයෝජන පිළිබඳ වැඩමුළු, සම්මන්ත්‍රණ සහ සාකච්ඡා සංවිධානය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැපයීම.
- සියලු ආකාර ළමා අපයෝජන අනාවරණය කර ගැනීම හා වැළැක්වීම හා සම්බන්ධයෙන් විදේශ ආණ්ඩු සහ අන්තර් ජාතික සංවිධාන සමග සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම සහ තොරතුරු හුවමාරු කර ගැනීම.

## අධිකාරියේ ව්‍යුහය

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ පහත ඒකක ක්‍රියාත්මක වේ.

- පරිපාලන හා මානම සම්පත් ඒකකය
- මූල්‍ය ඒකකය
- සැලසුම් හා තොරතුරු ඒකකය
  - පුස්තකාලය
- වැඩසටහන් ඒකකය
- මනෝසමාජීය ඒකකය
- නීති ඒකකය
- නීතිය බලාත්මක කිරීමේ ඒකකය
  - 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය
  - විමර්ශන ඒකකය
  - මධ්‍යම ලේඛනාගාරය
- අභ්‍යන්තර විගණන ඒකකය
- විශේෂ පොලිස් විමර්ශන ඒකකය

## 2015 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සංවිධාන ව්‍යුහය



**ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අනුමත කාර්යමණ්ඩලය - 2015**

| අංකය | තනතුර | වැටුප්- කේත අංකය | අනුමත සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | සාමාන්‍යාධිකාරි | HM -2-1 | 01 |
| 02 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි | HM -1-3 | 01 |
| 03 | කළමණාකරු - පරිපාලන හා මානව සම්පත් | HM -1-1 | 01 |
| 04 | කළමණාකරු - මූල්‍ය | HM -1-1 | 01 |
| 05 | කළමණාකරු - නීති | HM -1-1 | 01 |
| 06 | සායනික මනෝවිද්‍යාඥ | HM -1-1 | 01 |
| 07 | කළමණාකරු - සැලසුම් හා තොරතුරු | HM -1-1 | 01 |
| 08 | කළමණාකරු - වැඩසටහන් | HM -1-1 | 01 |
| 09 | සහකාර කළමණාකරු - පරිපාලන | MM -1-1 | 01 |
| 10 | සහකාර කළමණාකරු - නීති | MM -1-1 | 01 |
| 11 | සහකාර කළමණාකරු - වැඩසටහන් | MM -1-1 | 01 |
| 12 | සහකාර කළමණාකරු - මනෝවිද්‍යා | MM -1-1 | 01 |
| 13 | සහකාර කළමණාකරු - සැලසුම් හා තොරතුරු | MM -1-1 | 01 |
| 14 | සහකාර කළමණාකරු - නීතිය බලාත්මක කිරීම | MM -1-1 | 01 |
| 15 | ගණකාධිකාරි | MM -1-1 | 01 |
| 16 | අභ්‍යන්තර විගණක | MM -1-1 | 01 |
| 17 | අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් | JM – 1-1 | 01 |
| 18 | පරිපාලන නිලධාරි | JM – 1-1 | 01 |
| 19 | වැඩසටහන් නිලධාරි | JM – 1-1 | 01 |
| 20 | ගිණුම් නිලධාරි | JM – 1-1 | 01 |
| 21 | විමර්ශන නිලධාරි | JM – 1-1 | 01 |
| 22 | මාධ්‍ය හා තොරතුරු නිලධාරි | JM – 1-1 | 01 |
| 23 | සැලසුම් හා නියාමන නිලධාරි | JM – 1-1 | 01 |
| 24 | පර්යේෂණ හා සුභසාධන නිලධාරි | JM – 1-1 | 01 |
| 25 | පරිවර්තක (ඉංග්‍රිසි) | MA - 4 | 01 |
| 26 | පරිවර්තක (දමිල) | MA - 4 | 01 |
| 27 | දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරි | MA - 3 | 25 |
| 28 | දිස්ත්‍රික් මනෝසමාජීය නිලධාරි | MA - 3 | 25 |
| 29 | ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරි | MA - 3 | 360 |
| 30 | පරිපාලන සහකාර | MA - 3 | 01 |
| 31 | ගිණුම් සහකාර | MA - 3 | 03 |
| 32 | මාධ්‍ය සහකාර | MA - 3 | 03 |
| 33 | පුස්තකාලයාධිපති | MA - 3 | 01 |
| 34 | සැලසුම් සහකාර | MA - 3 | 01 |
| 35 | නීති සහකාර | MA - 3 | 03 |
| 36 | විමර්ශන සහකාර | MA - 3 | 02 |
| 37 | උපදේශන සහකාර | MA - 3 | 04 |
| 38 | වැඩසටහන් සහකාර | MA - 3 | 03 |
| 39 | වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ සහකාර | MA - 3 | 01 |
| 40 | අන්තර්ජාල ආවේක්ෂණ සහකාර | MA - 3 | 01 |
| 41 | චිකිත්සක | MA - 3 | 03 |
| 42 | කළමණාකරන සහකාර (තාක්ෂණික) | MA – 2-1 | 16 |
| 43 | තොරතුරු තාක්ෂණ සහකාර | MA – 2-1 | 02 |

| | | | |
|---|---|---|---|
| 44 | කළමණාකරන සහකාර (තාක්ෂණික නොවන) | MA – 1-1 | 29 |
| 45 | රියදුරු | PL-3 | 07 |
| 46 | පණිවිඩකරු | PL-1 | 01 |
| 47 | කාර්යාල කාර්ය සහයක | PL-1 | 03 |
| 48 | කාර්යාල කම්කරු | PL-1 | 02 |
| **මුළු සංඛ්‍යාව** | | | **522** |

# සංවර්ධන වැඩසටහන්

## අන්තර්ජාලය හා දුරකථනය හරහා ළමුන්ට අනිසි බලපෑම් සිදුකරන පුද්ගලයින්ට එරෙහිව ක්‍රියාත්මක වීමට කාර්යසාධන බලකායක් පිහිටුවීම.

ෆේස්බුක් වැනි සමාජ ජාල වෙබ් අඩවි ඇතුළු අන්තර්ජාලය මගින් සහ දුරකථන මගින් ළමයින්ට ලිංගික බලපෑම ඇතුළු හිරිහැර සිදුකරන පුද්ගලයන්ට එරෙහිව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නීති සම්පාදනය සඳහා බලකායක් පත් කිරීමට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය කටයුතු කර තිබේ. මෙම කාර්ය සාධන බලකායට ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ, නීතිපති දෙපාර්තමේන්තුවේ, අධිකරණ අමාත්‍යාංශය, ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය සහ රාජ්‍ය නොවන සංවිධාන වල සාමාජිකයන් ඇතුලත්ය.

මෙම කාර්ය සාධන බලකායට අයත් විශේෂඥ දැනුම ඇති සාමාජිකයන් පහත පරිදිවේ.

01. ආචාර්ය නටාෂා බාලේන්ද්‍ර මහත්මිය - සභාපති - ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

02. නීතිඥ සජීව සමරනායක මහතා - නියෝජ්‍ය සභාපති - ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

03. සුහද ගම්ලත් මහතා - අතිරේක සොලිසිටර් ජෙනරාල් - නීතිපති දෙපාර්තමේන්තුව

04. නන්දන මුණසිංහ මහතා - ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති - පොලිස් දෙපාර්තමේන්තුව

ළමයින්ට සහ යෞවනයින්ට හිරිහැර කිරීමට (Bullying), හිංසාකිරීමට (Harresment) ඔවුන් පසුපස ලුහුබදිමින් පීඩා කිරීමට (Disturbing) හෝ බියගන්වා බලෙන් මුදල් ලබාගැනීමට (Extortion) අන්තර්ජාලය හෝ ජංගම දුරකථන වැනි වූ උපකරණ භාවිතාකරණ පුද්ගලයින්ට එරෙහි විමර්ශන සිදු කිරීමටත් නීතියෙන් ලැබිය හැකි උපරිම බලය යොදමින් නඩු පැවරීමටත් මෙම කාර්යසාධන බලකාය විසින් නොපමාව ආරම්භ කරනු ඇත. තවද අන්තර්ජාලය ආශ්‍රිතව සිදුවන ළමා අපයෝජනයන්ට අදාළ වන නීති සම්පාදනය කිරීමත් ළමා වින්දිතයින් සඳහා මෙම කාර්යසාධන බලකාය කටයුතු කර ඇත. මෙම වර්ෂයේදි අන්තර්ජාල අවභාවිතය සම්බන්ධයෙන් හා විමර්ශන කටයුතුවලට අදාළ දත්ත පරිගණක සේවා සපයන ආයතනයන්ගෙන් ලබාගෙන පැමිණිලි විමර්ශනය

විධිමත් කිරීම. ලංකාවේ නීතිමය තත්වයක් නොමැති බැවින් නීති පද්ධතියක් සකස් කිරීම සඳහා විදුලි සංදේශන නියාමන කොමිෂන් සභාව සමග සාකච්ඡා කරන ලදි . තවද අන්තර්ජාලය භාවිතා කිරීමේ අවධානම් සහගත පාසල් සහ සමාජ පද්ධතීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත. එම වැඩසටහන් සඳහා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය අවශ්‍ය සහය ලබා දෙන ලදි. පෙබරවාරි මස 07 වෙනි දිනට යෙදෙන "අන්තර්ජාතික සුරක්ෂිත අන්තර්ජාල දිනය" සැමරීමේ ප්‍රධාන සම්පත්දායකයෙක් ලෙස ජාතික ළමා ආරක්ෂක අධිකාරිය කටයුතු කරයි.

## සුනාමි ව්‍යසනය හේතුකොට ගෙන වින්දිත වූ ළමුන් සඳහා පුනරුත්ථාපන කටයුතු හා සුබසාධන කටයුතු සිදුකිරීම

2004 වර්ෂයේ දෙසැම්බර් මස 26 වන දින ඇතිවූ සුනාමි ව්‍යසනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් දෙමාපියන් අහිමි වූ වයස අවුරුදු 18 ට අඩු සෑම ළමයෙකුටම හා අවුරුදු 21ට අඩු යෞවනයෙකුටත් දෙමාපිය දෙදෙනාගෙන් එක් අයෙකු අහිමිව හා ජීවත්ව සිටින මවට හෝ පියාට රැකවරණය සැපයීමට හා ආරක්ෂාව සැපයීමට හැකියාවක් නොමැති සෑම ළමයෙකුටම හා යෞවනයෙකුටම 2005 අංක 16 දරණ සුනාමි විශේෂ විධිවිධාන පනත මඟින් රැකවරණය සැපයීම හාමෙම පනත මඟින් එකී කටයුතු සිදු කිරීමට ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පවරා ඇත.

ඒ අනුව සුනාමි ව්‍යසනය හේතු කොට ගෙන වින්දිත වූ ළමුන් උදෙසා කැපකරු මාපිය රැකවරණ කටයුතු, පසුවිපරම් කටයුතු හා සුභසාධන කටයුතු ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සිදු කරයි. 2015 වර්ෂයේ සුනාමි වැඩසටහන් 08ක් පවත්වා ඇත. එහිදී ළමුන් 100 දෙනෙකු සඳහා සහන සපයා ඇත.

## නිවාස ගත ළමුන් හදිසි අනතුරුවලින් වළක්වා ගැනීම සඳහා වැඩසටහනක් පැවැත්වීම

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් 2015 වර්ෂය තුළදී සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා ඒකාබද්ධව ළමුන් හදිසි අනතුරුවලින් වළක්වා ගැනීමට අදාළව දීපව්‍යාප්තව නිවාසගත ළමුන් උදෙසා දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කර ඇත. මේ යටතේ 2015 වර්ෂය තුළ දැනුවත් කිරීමේ වැඩසටහන් 89 ක් ක්‍රියාත්මක කර ඇත. දැනුවත් කර ඇති සංඛ්‍යාව 3,644 දෙනෙකි.

## පාසල් ළමා ආරක්ෂක කමිටු

පාසල ළමා ආරක්ෂාව සම්බන්ධව වෙනසක් කළ හැකි ස්ථානයක් ලෙස හඳුනාගත් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒකාබද්ධව දිවයින පුරා පාසල් තුළ"සුරැකුම් පච්ච" නමින් පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලබයි. 2011 අංක 17 දරණ අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද චක්‍රලේඛය ඒ සම්බන්ධ මගපෙන්වීම් සිදු කරයි. මෙම කමිටු පිහිටුවීමේ අරමුණු අතර, පාසල් පරිශ්‍රය තුළළමා හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීම, පාසල් පද්ධතිය තුළළමුන් අපයෝජනයට ලක්වීමේ අවදානම් සහගත බව අවම කිරීම, යහපත්

ගුරු සිසු දෙමාපිය අන්තර් සම්බන්ධතා ගොඩනැංවීම, සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් ළමුන් ආරක්ෂා කර ගැනීම සහ ළමුන්ගේ පෞරුෂත්ව වර්ධනය යනාදිය වේ.

මෙහි විශේෂ අංගයක් වනුයේ ළමුන්ගේ මානසික තත්ත්වයන් හඳුනාගැනීමට හා ඔවුන්ට සහයවීමට ඔවුන්ගේ ගැටලු සහ අදහස් සඳහන් කර බහාලීම සඳහා "සිනහ කඳුළු පෙට්ටිය" නම් පෙට්ටි පාසල් තුළ ස්ථාපිත කිරීමයි.මේ අනුව, 2015 වර්ෂය තුළදී දිස්ත්‍රික් මට්ටමින් පාසල් 1,856 ක් සඳහාසිනහකඳුළු පෙට්ටි ලබාදී ඇත. තවද, 2015 වර්ෂය තුළදී පාසල් ළමා ආරක්ෂක කමිටු ස්ථාපිත

කිරීම හාක්‍රියාත්මක කිරීම යටතේ පාසල් ළමුන් 41,780 දෙනෙක් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇති අතර, එම වැඩසටහන්හි සම්බන්ධීකරණ කටයුතු ජාතික ළමා ආරක්ෂක අධිකාරියෙහි දිස්ත්‍රික් හා ප්‍රාදේශීය නිලධාරීන් විසින් සිදු කර ඇත.



## සිවිල් සංවිධාන සාමාජිකයන් දැනුවත් කිරීම

සෑම ළමයෙකුම සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් ආරක්ෂා කිරීම පිළිබඳ දැනුම, අවබෝධය හා කුසලතා ප්‍රජාව තුළ මෙන්ම ළමුන් තුළ ද වර්ධනය කිරීම හා ඒ සඳහා සිවිල් සමාජය ශක්තිමත් කිරීමේ අරමුණින් යුතුව ගම් මට්ටමින් සිවිල් සමාජ ක්‍රියාකාරීන් බලාත්මක කිරීමේ හා ජාලගතකිරීමේ වැඩසටහන් මාලාවක් 2015 වර්ෂය තුළදී ජාතික ළමා ආරක්ෂක අධිකාරිය දියත් කර ඇත. ඒ අනුව

සෑම දිස්ත්‍රික්කයකම සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් ම ආවරණය වන පරිදි 2015 වර්ෂය තුළ දැනුවත් කිරීමේ වැඩසටහන් 460ක් ක්‍රියාත්මක කර ඇති අතර, එමගින් දැනුවත් කර ඇති ප්‍රතිලාභින් සංඛ්‍යාව 45,420 කි.

## සෞඛ්‍ය වෘත්තිකයන් දැනුවත් කිරීම

සෞඛ්‍ය වෘත්තිකයන්ගේ කුසලතා සංවර්ධනය කිරීම උදෙසා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. එහි ප්‍රධාන අරමුණු අතර, සෞඛ්‍ය වෘත්තිකයන් ළමා ආරක්ෂාව සම්බන්ධ විවිධ ක්ෂේත්‍රයන්හි දැනුමින් හා කුසලතාවලින් සන්නද්ධ කරලීම තුළින් ළමා ආරක්ෂාව සම්බන්ධ වඩාත් සංවේදී වෘත්තිකයන් පිරිසක් බිහි කරලීම, රාජ්‍ය නිලධාරියෙකු ලෙස ළමා අපයෝජනයකදී හෝ එවැනි අවදානම් තත්ත්වයකදී ක්‍රියාත්මක විය යුතු ආකාරය සම්බන්ධයෙන් නිසි දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීම තුළින් වඩාත් ඵලදායි ලෙස එම ගැටළු නිරාකරණය කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණයන් සිදු කිරීමට අවශ්‍ය මගපෙන්වීම් සිදු කිරීම මෙන්ම, සෞඛ්‍ය වෘත්තිකයන් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සමඟ පවත්වන සබඳතාවය ශක්තිමත් කරලීම තුළින් ළමා අපයෝජන අවම කරලීම යනාදිය වේ. ඒ අනුව 2015 වර්ෂය තුළදී පහත සඳහන් පරිදි සෞඛ්‍ය වෘත්තිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

### හෙද නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන

| දිනය | ස්ථානය | ප්‍රතිලාභින් සංඛ්‍යාව |
|---|---|---|
| 2015.04.07 | ලංකා හොස්පිටල්හි හෙද විදුහල් ප්‍රධාන ශාලාව - නාරාහේන්පිට | 70 |
| 2015.07.30 | හෙද විදුහල් ශ්‍රවණාගාරය - මුල්ලේරියාව | 61 |
| **මුළු සංඛ්‍යාව** | | **131** |

### පශ්චාත් වෛද්‍ය උපාධිය හදාරනු ලබන වෛද්‍යවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන

| දිනය | ස්ථානය | ප්‍රතිලාභින් සංඛ්‍යාව |
|---|---|---|
| 2015.08.25 | ජාතික ළමා ආරක්ෂක අධිකාරි ශ්‍රවණාගාරය | 53 |
| **මුළු සංඛ්‍යාව** | | **53** |

**පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන**

| දිනය | ස්ථානය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| 2015.01.19 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය ශ්‍රවණාගාරය - මාතර | 51 |
| 2015.02.19 | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලීය ශ්‍රවණාගාරය - මඩකලපුව | 68 |
| 2015.03.02 | කළමනාකරණ කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය - යාපනය | 63 |
| 2015.09.10 | දිස්ත්‍රික් ලේකම් කාර්යාල ශ්‍රවණාගාරය - හම්බන්තොට | 75 |
| 2015.10.20 | දිස්ත්‍රික් ලේකම් කාර්යාල ශ්‍රවණාගාරය - මාතලේ | 51 |
| 2015.11.05 | දිස්ත්‍රික් ලේකම් කාර්යාල ශ්‍රවණාගාරය - අනුරාධපුරය | 79 |
| **මුළු සංඛ්‍යාව** | | **387** |

**දන්ත චිකිත්සක පුහුණු නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන**

| දිනය | ස්ථානය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| 2015.08.11 | දන්ත සෞඛ්‍ය ආයතනය - මහරගම | 49 |
| **මුළු සංඛ්‍යාව** | | **49** |



## ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු සිසුන් දැනුවත් කිරීම

ළමා ආරක්ෂාව සම්බන්ධ විවිධ ක්ෂේත්‍රයන් පිළිබඳ දැනුම සහ කුසලතා ලබාදීම තුළින් ළමා ආරක්ෂාව සම්බන්ධ සවිඥානික හා සංවේදී ගුරු ප්‍රජාවක් බිහිකරලීම ප්‍රධාන අරමුණු කොට ගනිමින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයන්හි ඉගෙනුම ලබන ගුරු සිසුන් උදෙසා දැනුවත් කිරිමේ වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරනු ලබයි.2015 වර්ෂය තුළදී පහත සඳහන් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයන්හි ගුරු සිසුන් උදෙසා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

| දිනය | ස්ථානය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| 2015.07.22 | පස්දුන්රට ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ශ්‍රවණාගාරය - කළුතර | 234 |
| 2015.07.24 | රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ශ්‍රවණාගාරය - රත්නපුර | 166 |
| 2015.07.28 | මහවැලි ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ශ්‍රවණාගාරය - පොල්ගොල්ල | 262 |
| 2015.09.18 | සියනෑජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ශ්‍රවණාගාරය - වේයන්ගොඩ | 210 |
| 2015.09.28 | ඌව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ශ්‍රවණාගාරය - බිඳුණුවැව | 148 |
| 2015.10.01 | පේරාදෙණිය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ශ්‍රවණාගාරය - පැණිදෙණිය | 242 |
| 2015.10.18 | නිල්වලා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ශ්‍රවණාගාරය - අකුරැස්ස | 207 |
| 2015.10.27 | පුලතිසි ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ශ්‍රවණාගාරය පොළොන්නරුව | 201 |
| 2015.11.25 | වව්නියාව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ශ්‍රවණාගාරය - වව්නියාව | 225 |
| **මුළු සංඛ්‍යාව** | | **1895** |



## ප්‍රංශ පොලීසිය විසින් සිදුකරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන

1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනත ප්‍රකාරව 14 වගන්තියේ (ණ) අනුව සියලු ආකාර ළමා අපයෝජන අනාවරණ කර ගැනීම හා වැළැක්වීම හා සම්බන්ධයෙන් විදේශ ආණ්ඩු සහ අන්තර් ජාතික සංවිධාන සමග සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම සහ තොරතුරු හුවමාරු කර ගැනීමට අනුව ප්‍රංශ පොලීසිය විසින් 2015.11.16 වනදින සිට 2015.11.20 වන දින දක්වා විශේෂයෙන්ම අන්තර්ජාල ආවේක්ෂණය සහ අපරාධ විමර්ශන පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදි. මෙම වැඩමුළුව ප්‍රංශ පොලීසිය විසින් නොමිලේ සම්පත්දායකත්වය ලබාදී ඇත. මෙම වැඩමුළුව සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විශේෂ පොලිස් විමර්ශන ඒකකයේ නිලධාරීන්, ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නීතිය බලාත්මක කිරීමේ අංශයේ නිලධාරීන්,පොලිස් අපරාධ කොට්ඨාසයේ නිලධාරීන්, පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයේ නිලධාරීන් සහ පොලිස් ළමා හා කාන්තා කාර්යාංශයේ නිලධාරීන් 25 දෙනෙකු මෙම වැඩමුළුව සඳහා සහභාගි විය.



## ළමා හිංසනයට එරෙහි ජාතික දිනය

ශ්‍රි ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර 1581/21 දරණ 2008 දෙසැම්බර් 26 නිකුත් කළ ගැසට් පත්‍රය මඟින් එවකට ළමා සංවර්ධන හා කාන්තා කටයුතු ආමාත්‍ය ගරු සුමේධා ජී. ජයසේන මැතිනිය විසින් සෑම වසරකම ජනවාරි 04 දින ළමා හිංසනයට එරෙහි ජාතික දිනය ලෙස ප්‍රකාශයට පත් කරන ලදි. මෙම දිනයට සමගාමීව ළමා හිංසනයට එරෙහිව ප්‍රජාව දැනුවත් කිරීම වෙනුවෙන් 2015 වර්ෂයේදී ඩේලි නිවුස්, තිනකරන්, දිවයින, ලංකාදීප සහ රිවිර යන පුවත්පත්වල දැනුවත්වීමේ දැන්වීම් පළ කරන ලදි.










## ළමා ශ්‍රමිකත්වයට එරෙහි ජාත්‍යන්තර දිනය සැමරීම

2015 ජූනි 12 වන දිනට යෙදුණු ළමා ශ්‍රමිකත්වයට එරෙහි ජාත්‍යන්තර දිනය සැමරීමේ ජාතික උත්සවය එවකට ළමා කටයුතු රාජ්‍ය අමාත්‍ය රෝසි සේනානායක මැතිනියගේ ප්‍රධානත්වයෙන් කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදි. මෙවර එහි තේමාව වූයේ "ළමා ශ්‍රමිකත්වය පිටු දකිමු, ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදෙමු" යන්නයි. එදින දැනුවත් කිරීමේ පාගමනක් කොළඹ නිදහස් චතුරස්‍රයේ සිට බණ්ඩාරනායක ජාත්‍යන්තරඅනුස්මරණ ශාලාව දක්වා පවත්වන ලදි. මෙම දැනුවත් කිරීමේ පාගමන සඳහා පාසල් ළමුන්, දෙමාපියන්, ගුරුවරුන් සහ සිවිල් සංවිධාන නියෝජිතයන් ඇතුලු 1,500 කට අධික පිරිසක් සහභාගි විය. එදිනම ළමා ශ්‍රමිකත්වය ඇතුලු සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් ළමුන් ආරක්ෂා කර ගැනීමට අදාළව විශේෂ දේශනයක් ද පවත්වන ලදි. එම දේශනය පවත්වන ලද්දේ ආචාර්ය ප්‍රනීත් අබේසුන්දර මහතා විසිනි. එහිදී ළමා අපයෝජනයන්ගෙන් ආරක්ෂාවීමට අදාළ සකසන ලද ප්‍රකාශන ද සහභාගිවූ ළමුන්ට ලබාදීම සිදු කරන ලදි.








## ළමා ශ්‍රමිකත්වයටඑරෙහිජාත්‍යන්තර දිනය සැමරීමට සමගාමීව සමස්ත ලංකා මට්ටමින් ගද්‍ය රචනා තරඟයක් පැවැත්වීම

ළමා ශ්‍රමිකත්වයට එරෙහිව ජාත්‍යන්තර දිනය සැමරීම වෙනුවෙන් එයට සමගාමීව සමස්තලංකා මට්ටමින් ගද්‍ය රචනා තරගයක් ද සංවිධානය කරන ලදි. ඒ සඳහා කනිෂ්ඨ අංශය (9 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා) සහ ජ්‍යෙෂ්ඨ අංශය (12 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා) වශයෙන් "ළමා ශ්‍රමිකත්වය පිටු දකිමු, ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදෙමු" යන මාතෘකාවට අනුව මෙම තරඟය පවත්වන ලදි. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍ය පාසල් සිසු සිසුවියන්ගේ නිර්මාණ ලබාගත් අතර, දිස්ත්‍රික් හා සමස්ත ලංකා මට්ටමින් ජයග්‍රාහකයන් තෝරා ගන්නා ලදි. ජයග්‍රාහකයන්ට පදක්කම්, ත්‍යාග හා සහතිකපත් පිරිනැමීම එවකට ළමා කටයුතු අමාත්‍ය රෝසි සේනානායක මැතිනියගේ ප්‍රධානත්වයෙන් සිදුවිය.




## ලෝක ළමා දිනය සැමරීමේ ජාතික වැඩසටහන

2015 ලෝක ළමා දිනය සමරනු ලැබුවේ "ළමා මිතුරු පරිසරයක්, ලොව බබලන සොඳුරු දැයක්."යන තේමාව යටතේයි. ජාතික උත්සවය යාපනය වීරසිංහම් ශාලාවේ පැවති අතර, ඊට සමගාමීව ළමුන් සඳහා වූ මනෝසමාජීය ක්‍රියාකාරකම් ඇතුළත්වූ විශේෂ වැඩසටහනක් යාපනය ළමා උද්‍යානයේදී ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් පවත්වන ලදී. ඒ සඳහා යාපනය දිස්ත්‍රික්කයේ ළමුන් 500 කට අධික පිරිසක් සහභාගි විය. ළමා අපයෝජනයන්ගෙන් ආරක්ෂා වීම පිළිබඳව සහභාගි වූ ළමුන් දැනුවත් කිරීමද මෙහිදී සිදු කරන ලදී.




## ලෝක ළමා දිනයට සමගාමීව පාසල් ළමුන් සඳහා පෝස්ටර් තරගයක් පැවැත්වීම

ලෝක ළමා දිනයට සමගාමීව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පාසල් ළමුන් සඳහා පෝස්ටර් තරගයක් පැවැත්විය.එහිදී වයස අවුරුදු 14-18 දක්වා පාසල් සිසු සිසුවියන්ගේ නිර්මාණ මෙම තරගය සඳහා ඉදිරිපත් කරන ලදී.මෙහි මාතෘකාව වුයේ අන්තර්ජාලය හා ජංගම දුරකථනය ප්‍රවේශමෙන් භාවිතා කරමු යන්නයි. එය පාසල් ළමුන් වයස් කාණ්ඩ 2ක් යටතේ නිර්මාණ සිදු කර ඇත. 14-16 හා 17-18 වශයෙනි.









## ලෝක ළමා දිනයට සමගාමීව "අන්තර්කරණ අධ්‍යාපනය හා ළමා ආරක්ෂණය පිළිබඳ"ප්‍රතිපත්තිමය සංවාදයක් පැවැත්වීම

2015 ලෝකළමා දිනයට සමගාමීව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව "අන්තර්කරණ අධ්‍යාපනය හා ළමා ආරක්ෂණය පිළිබඳ" ප්‍රතිපත්තිමය සංවාදයක් සංවිධානය කරන ලදි. 2015 ඔක්තෝම්බර් මස 08 වන දින බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ ශාලාවේ පවත්වන ලදි.මේ සඳහා 51 දෙනෙකු සහභාගී වී ඇත.



## ගැහැණු ළමයාගේ ජාත්‍යන්තර දිනය

ගැහැණු ළමයාගේ ජාත්‍යන්තර දිනය "දියණියේ ඔබයි යෞවනයේ ශක්තිය"තේමා කරගනිමින්මෙමදිනයසමරනු ලැබීය. මෙහි ජාතික වැඩසටහන 2015 ඔක්තෝබර් 11 වන දින, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගන යනු ලබන ළමා රැකවරණ මධ්‍යස්ථානවල සිටින වයස අවුරුදු 12-18 අතර ළමුන් 100 දෙනෙකුගේ සහභාගිත්වයෙන් වැඩමුළුවක් ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පැවැත්විය. මෙම වැඩසටහනේදී ළමා ආරක්ෂාව, සම්බන්ධතා අධ්‍යාපනය, නායකත්වය,කණ්ඩායම් හැඟීම සහ සෞන්දර්යය අධ්‍යාපනය වැනි අංශ කෙරෙහි අවධානය යොමු කරන ලදි.



## තොරතුරු ලබාදීම

ළමා ආරක්ෂාව, ළමා අපයෝජනය සහ ළමා අයිතිවාසිකම් පිළිබඳ මහජනතාවට අවශ්‍ය තොරතුරු ලබාදීම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සිදු කරයි. එහිදී අවශ්‍යතාවය පරිදි පෝස්ටර්, අත්පත්‍රිකා, පොත්, ස්ටිකර්, මුද්‍රිත ප්‍රකාශන සහ රූපමය වාර්තා වැඩසටහන් ලබාදීම සිදු කරයි. 2015 වසරේ දී ලබා දී ඇති ප්‍රකාශන සංඛ්‍යාව 484,040 කි.



## ප්‍රදර්ශන හා ජංගම සේවා පැවැත්වීම

විවිධ ආයතන මඟින් අධ්‍යාපනික ප්‍රදර්ශන සංවිධානය කරනු ලබන අතර ලැබෙන ඉල්ලීම් මත එම ප්‍රදර්ශන සඳහා ළමා ආරක්ෂාව පිළිබඳව දැනුවත් කිරීමේ අධ්‍යාපනික ප්‍රදර්ශන කුටි පැවැත්වීමට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය කටයුතු කරයි. එමෙන්ම ප්‍රාදේශීය මට්ටමින් පවත්වන ජංගම සේවා සඳහා ද ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සිය දායකත්වය ලබාදීම සිදු කරයි.මෙමගින් ළමා ආරක්ෂාව පිළිබඳව දැනුවත් වීම සමාජ ගත කිරීම සඳහා කටයුතු කොට ඇත. 2015වර්ෂයේදී ජංගම සේවා 10 ක් පවත්වා ඇත.



## ළමා ආරක්ෂාවට අදාළ තොරතුරු ජනමාධ්‍ය හරහා ජනතාව අතරට රැගෙනයාම

රට තුළ ළමා ආරක්ෂාව තහවුරු කිරීමට අදාළ තොරතුරු ජනමාධ්‍ය ආයතන හා සම්බන්ධීකරණය වෙමින් මහජනතාව අතරට රැගෙනයාමට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය කටයුතු කරයි.එහිදී විද්‍යුත් මෙන්ම මුද්‍රිත මාධ්‍යන්ගේ සහයෝගයද ලබා ගැනේ.ළමා ආරක්ෂාවට අදාළව ප්‍රවෘත්ති නිවේදන ජනමාධ්‍ය වෙත නිකුත් කිරීම, විෂය කරුණු වලට අදාළව ප්‍රවෘත්ති සාකච්ඡා පැවැත්වීම, රූපවාහිනි හා ගුවන් විදුලි දැන්වීම් ප්‍රචාරය කිරීම,පුවත්පත් දැන්වීම් පලකිරීම ආදිය සිදු කරයි. එමෙන්ම ගුවන් විදුලි හා රූපවාහිනීවැඩසටහන් සඳහා සම්පත් දායකත්වය ලබාදීමද සිදු කරයි. 2015 වර්ෂයට අදාළව ප්‍රවෘත්ති නිවේදන 16, පුවත්පත් දැන්වීම් 05 සහ රූපවාහිනි දැන්වීම් 01 සිදු කර ඇත.






## ළබැඳි පුවත් හසුන




“පුවත් හසුනකට වඩා වැඩි යමක් ”යන තේමාව යටතේ සැකසුනු ළබැඳි නමින් වූ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල පුවත් හසුන ත්‍රෛමාසිකව ප්‍රකාශයට පත් කිරීමඅධිකාරිය විසින් සිදු කරනු ලබයි. මෙය සාම්ප්‍රදායික පුවත් හසුනකට වඩා වෙනස් වූ අයුරකින් ප්‍රකාශයට පත් වන්නකි. මෙහි මූලික අරමුණ වන්නේ ළමා ආරක්ෂාව පිළිබඳව ගුරුවරුන්, දෙමාපියන්, ළමුන් ඇතුලු සියලු ප්‍රජාව දැනුවත් කිරීමයි. කාලීන වශයෙන් වූ තේමාවක් තෝරාගනිමින් ළබැඳි පුවත් හසුන නිර්මාණය කෙරේ. 2015 වර්ෂයේදී "ළමා ආරක්ෂාව සඳහා පවුල සවිමත් කිරීම" ළබැඳි පුවත් හසුන ප්‍රකාශයට පත් කරන ලදි.

## 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවාව



ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතේ 14 (ඔ)වගන්තිය ප්‍රකාරව ළමා අපචාර පිළිබඳවමහජන පැමිණිලි භාර ගැනීම සහ අවශ්‍ය අවස්ථාවලදී ඒ පැමිණිලි නිසි බලධාරීන් වෙත යොමු කිරීම සඳහා ක්‍රියා කරනු ලබයි. 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය 2010 ජූලි 22 වන දින ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පරිශ්‍රය තුළ ස්ථාපිත කරන ලදි. මෙය ළමා අපයෝජන පැමිණිලි භාරගැනීම සහ ඒවාට කඩිනම් ප්‍රතිචාර දැක්වීමේ ප්‍රමුඛතම යාන්ත්‍රණයද වේ. නොමිලයේ පැය 24 පුරාම ක්‍රියාත්මක වන මෙම දුරකථන සේවය ළමා ආරක්ෂාවේ සුවිශේෂී සන්ධිස්ථානයක් ලෙස හැදින්විය හැකිය. එමඟින් සමාජය තුළ සැඟව තිබූ ළමා අපයෝජන සිදුවීම් වාර්තාවීමේ ප්‍රවනතාවයක් දක්නට ලැබුණි.

ගාස්තු අයකිරීමකින් තොරව ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා ළමා දුරකථන සේවාව ඇමතීම මගින්, ඕනෑම කෙනෙකුට ළමයින් සම්බන්ධයෙන් පැනනගින ගැටළු මෙන්ම ළමා අපයෝජන සම්බන්ධයෙන් පැමිණිලි සිදු කිරීමට හැකියාව පවතියි. මෙමගින් උපදේශන සේවය ලබාගැනීමටද අවස්ථාව ලැබේ.

මෙම සේවාව මූලිකවළමුන් සඳහා වෙන්ව ඇතත් ගුරුවරුන්, දෙමව්පියන්, සහ ළමා රැකවරණ සපයන්නන් බඳු වැඩිහිටියන්ට ද, ළමුන් පිළිබඳ ඔවුන්ට ඇති ගැටළු, ළමුන් හදා වඩා ගැනීමේ පරිචයන් ආදිය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහාත් මෙම සේවාව භාවිතා කළ හැකිය.

2015 වසරේ දී 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය ඔස්සේ පැමිණිලි 10,087 ක් අධිකාරිය වෙත ලැබී ඇත. එහිදී පැමිණිලිවලට අදාළ විමර්ශන කටයුතු සිදු කොට අදාළ ගොනු වසා ඇති ප්‍රමාණය වන්නේ 4,879 කි. සෙසු සියලු පැමිණිලිවලට අදාළව මූලික ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, වැඩිදුර විමර්ශනයන් සහ මැදිහත්කරණයන්සිදු කරයි. මෙහිදී විමර්ශන කටයුතු කෙටි කාලීන වශයෙන් සහ දිගුකාලීන වශයෙන් ද සිදු කරනු ලබයි. 2015 වර්ෂය තුළ ලැබී ඇති සියලුම පැමිණිලිවලට අදාළ මූලික කටයුතු මෙම වර්ෂය ඇතුළතදී සිදුකර ඇත.

## ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි

ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත ලැබෙන ආකාර කිහිපයකි. "1929" ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය හරහා පැමිණිලි විශාල ප්‍රමාණයක් ලැබෙන අතර, අධිකාරියට පැමිණ වාචිකව පැමිණිලි ඉදිරිපත් කිරීම මගින්ද, ලිපි මගින්ද ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි සිදුකරනු ලබයි. මෙම ලැබෙන පැමිණිලි සියල්ල කඩිනමින් විභාගයට ගැනෙන අතර, පැමිණිල්ලේ ස්වභාවයට අනුව වර්ග කිරීමකට ද ලක්වේ. 2015 වර්ෂයේ ළමා අපයෝජන පැමිණිලි 10,732 ක් ලැබී ඇත.

| දිස්ත්‍රික්කය | ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව |
|---|---|
| අම්පාර | 246 |
| අනුරාධපුර | 573 |
| බදුල්ල | 271 |
| මඩකලපුව | 158 |
| කොළඹ | 1522 |
| ගාල්ල | 700 |
| ගම්පහ | 1187 |
| හම්බන්තොට | 439 |
| යාපනය | 198 |
| කළුතර | 634 |
| මහනුවර | 474 |
| කෑගල්ල | 404 |

| | |
|---|---|
| කිලිනොච්චි | 104 |
| කුරුණෑගල | 827 |
| මන්නාරම | 65 |
| මාතලේ | 222 |
| මාතර | 389 |
| මොණරාගල | 241 |
| මුලතිව් | 121 |
| නුවරඑළිය | 235 |
| පොළොන්නරුව | 302 |
| පුත්තලම | 540 |
| රත්නපුරය | 622 |
| ත්‍රිකුණාමලය | 130 |
| වව්නියාව | 128 |
| **මුළුසංඛ්‍යාව** | **10732** |

## නීතිමය කර්තව්‍යන්

1998 අංක 50 දරණ ජාතිකළමා ආරක්ෂක අධිකාරි පනත ප්‍රකාරව අපයෝජනයට ගොදුරු වු ළමුන් ආරක්ෂා කිරීම, ඔවුන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම,ළමා අපයෝජන පිටුදැකීම සඳහා වු නීතිමය පරිපාලනමය හෝ වෙනත් සංශෝධන නිර්දේශ කිරීම,ළමා අපයෝජන වලට අදාළ නීති ක්‍රියාත්මක කිරීමට උපදෙස් දීම සහ ළමා අපයෝජන සම්බන්ධ සියලු විමර්ශන හා අපරාධ නඩු කටයුතු වල ප්‍රගතිය නියාමනය කිරීම හා ඊට අදාළව අධිකරණයන්හි පෙනී සිටීම යනාදි කාර්යයන් නීති අංශය මඟින් ඉටු කරනු ලැබේ. අධිකාරි පනතට අමතරව පහත පනත් වලට අදාළවද කටයුතු කරයි.

- 2005 අංක 16 දරණ සුනාමි විශේෂ විධිවිධාන පනත.
- 2005 අංක 34 දරණ ගෘහස්ත ප්‍රචන්ඩ ක්‍රියා වැලැක්වීමේ පනත.

2015 වර්ෂයේ ජාතිකළමා ආරක්ෂක අධිකාරිය තුළ ක්‍රියාත්මක නීති අංශය මඟින් නීති උපදෙස් ලබාදීම් 2,251 ක් සිදු කර ඇත. එමෙන්ම අධිකරණයේ නඩු සඳහා පෙනී සිටිම් 69 ක් සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නීති අංශයේ නිලධාරින් සහභාගී වී ඇත.අධිකාරියෙන් පිටත පවත්වන රැස්වීම් 38 කටද මෙම ඒකකයේ නිලධාරින් සහභාගි වී ඇත.

**2015 වසර තුළ දි නීති අංශය දායක වූ නඩු සංඛ්‍යාව (2005 අංක 16 දරණ සුනාමිවිශේෂ විධිවිධාන පනත අනුව)**

| අධිකරණය | නඩු සංඛ්‍යාව |
|---|---|
| බත්තරමුල්ලළමා අධිකරණය | 11 |
| ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණය | 03 |
| කල්මුණේ අධිකරණය | 21 |
| බලපිටියමහේස්ත්‍රාත් අධිකරණය | 04 |
| මාතර මහේස්ත්‍රාත් අධිකරණය | 02 |
| කළුතර මහේස්ත්‍රාත් අධිකරණය | 01 |
| බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණය | 01 |
| ගංගොඩවිල මහේස්ත්‍රාත් අධිකරණය | 01 |
| | |
| ***මුළු සංඛ්‍යාව*** | **44** |

**2015 වසර තුළ නීති අංශය දායක වූ නඩු සංඛ්‍යාව (ළමා අපයෝජන සිද්ධි සඳහා)**

| අධිකරණය | නඩු සංඛ්‍යාව |
|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 07 |
| බත්තරමුල්ල මහේස්ත්‍රාත් අධිකරණය | 04 |
| දෙහිඅත්තකණ්ඩිය මහේස්ත්‍රාත් අධිකරණය | 03 |
| කළුතර මහේස්ත්‍රාත් අධිකරණය | 01 |
| මහනුවර දිසා අධිකරණය | 02 |
| ගංගොඩවිල මහේස්ත්‍රාත් අධිකරණය | 05 |
| කුරුණෑගල මහේස්ත්‍රාත් අධිකරණය | 02 |
| බලපිටිය මහේස්ත්‍රාත් අධිකරණය | 01 |
| බම්කරුඅධිකරණය | 02 |
| | |
| ***මුළු සංඛ්‍යාව*** | **27** |

## ළමා අපයෝජන වින්දිතයන්ගේසාක්ෂි වීඩියෝ පටිගත කිරීම

ළමා අපයෝජන හේතුවෙන් වින්දිතයන්බවට පත්වන ළමයින්ගේ සාක්ෂි වීඩියෝ පටිගත කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය තුළ විශේෂ ඒකකයක් ක්‍රියාත්මක වේ.1999 අංක 32 දරණ සාක්ෂි (විශේෂ විධිවිධාන) පනත ප්‍රකාරව, අපයෝජනයට ගොදුරුවී ඇතිළමයෙකුගේ සාක්ෂි වීඩියෝ පටිගත කර එය අධිකරණය වෙත ඉදිරිපත් කිරීමටත් මෙමගින් ඉඩ සැලසේ. 2015 වසර තුළ වීඩියෝ සාක්ෂි පටිගත කිරීම් 153 ක් සිදු කර ඇත.

## අන්තර්ජාල ආවේක්ෂණ ඒකකය ක්‍රියාත්මක කිරීම

අප සමාජය තුළ අන්තර්ජාල භාවිතය වර්ධනයත් සමග ඒ හරහාළමා අපයෝජන සිදු වීමත් එමෙන්ම ළමුන් අන්තර්ජාලය අවභාවිතය කිරීමක් දක්නට ලැබේ. 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතේ අංක 14 (ඉ) වගන්තිය යටතේ ළමා අපචාර වැළැක්වීමේ කාර්යය සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීම යන වගන්තිය හා වගන්ති අංක 40 යටතේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියට බලය පවරා ඇති දණ්ඩ නීති සංග්‍රහයේ 286 (අ), 345, 288 (ඉ)යන වගන්තිය යටතේ ළමයින්ට අදාළව සිදු කරනු ලබන අසභ්‍ය පළකිරීම් හා ප්‍රකාශන වැළැක්වීම යන වගන්ති ප්‍රකාරව එවැනි කටයුතු සිදු වන්නේ දැයි විමර්ශන කර බැලීම සහ ලැබෙන පැමිණිලිවලට අදාළ විමර්ශන කටයුතු මෙම ඒකකය මගින් ක්‍රියාත්මක කරයි. 2015 වර්ෂයේ දී සිදු කරන ලද විමර්ශන සංඛ්‍යාව 21 කි. අන්තර්ජාල සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් 22 ක් මෙම වසරේදී සිදු කර ඇත. වැඩිහිටියන් 300 දෙනෙක්, නිලධාරීන් 540දෙනෙක් සහළමුන් 1,950 දෙනෙකු දැනුවත් කර ඇත. දැනුවත් කර ඇති මුළු සංඛ්‍යාව 2,790 කි.

## විශේෂ පොලිස් විමර්ශන

ජාතික ළමා ආරක්ෂක අධිකාරියට 1929 ශ්‍රී ලංකාළමා දුරකථන සේවය ඔස්සේ හා ඍජුව විශේෂ පොලිස් විමර්ශන ඒකකයට ලැබෙන ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි කඩිනමින් විමර්ශනය කර නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විශේෂ පොලිස් විමර්ශන ඒකකය කටයුතු කරමින් සිටියි. ඒ වෙනුවෙන් 24 පැය පුරාවටම ක්‍රියාත්මක වන නිලධාරි කණ්ඩායමක්ද මෙම ඒකකයේ සේවය කරයි.

**2015 වර්ෂයේදී විශේෂ පොලිස් විමර්ශන ඒකකයට ඍජුව ලැබුණු පැමිණිලි**

| පැමිණිල්ලේ ස්වභාවය | පැමිණිලි ගණන | විමර්ශනයේ වර්තමාන තත්ත්වය (මූලික පොලිස් විමර්ශන) | අධිකරණයේ විභාග වන ගණන | අධිකරණයේ විභාග අවසන් ගණන |
|---|---|---|---|---|
| සුළු අපරාධ | 43 | අවසන් | 33 | - |
| විවිධ පැමිණිලි | 90 | අවසන් | - | - |
| බාල අපරාධ | 29 | අවසන් | 29 | 09 |
| **මුළු සංඛ්‍යාව** | **162** | **-** | **62** | **09** |

## මනෝසමාජීයවැඩසටහන්

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය තුළ ක්‍රියාත්මක මනෝසමාජීය අංශය මගින් ළමා අපයෝජන සහ ළමා අයිතිවාසිකම් කඩවීම හේතුවෙන් වින්දිත බවට පත්වන ළමුන්ගේ මානසික සෞඛ්‍ය නගා සිටුවීම සඳහා අවශ්‍ය වන්නාවූ මානසික උපදේශන සේවා සැපයීම සහ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. දිස්ත්‍රික් මනෝසමාජීය නිලධාරින්ගේ ද සහය මේ සඳහා ලැබෙයි. 2015 වර්ෂයේ මනෝ උපදේශන සේවා සැපයීම් 171 ක් ද, වීඩියෝ සාක්ෂි පටිගත කිරීම සඳහා ළමුන් සූදානම් කිරීම් 154 ක් ද, මනෝසමාජීය සහය සැපයීම් 368 ක් ද, විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් 28 ක් ද පාසල් දැනුවත් කිරීම් 10 ක් ද සිදු කරන ලදි. එමෙන් ම 1929 ළමා දුරකථන සේවය හරහා ලැබුන නව

පැමිණිලි සංඛ්‍යාව වන 1,218 අදාළ කටයුතු සිදු කිරීම. පැමිණිලිවලට අදාළ පසුවිපරම් කටයුතු 1,522 ක් සිදු කරන ලදි. මෙම වසරේදී ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය නිලධාරීන් මත්ද්‍රව්‍ය උවදුර සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් 2ක් පවත්වන ලදි.
එමෙන්ම නිදහස් චින්තනයක් ළමයා තුළ ඇති කිරීමේ අරමුණින් මනෝසාමාජීය ක්‍රියාකාරකම් අධිකාරිය මඟින් ක්‍රියාවට නංවයි. ළමයා තුළ නිර්මාණශීලිත්වය වර්ධනය කිරීම ද මනෝසමාජීය ක්‍රියාකාරකම් වලදී සිදුකෙරේ.

## දිරිදරු සුරැකුම් පියස සම්පත් මධ්‍යස්ථාන

දිරිදරු සුරැකුම් පියස සම්පත් මධ්‍යස්ථාන පිහිටුවීමේ ප්‍රධාන අරමුණු අතර, දෙමව්පියන් විදේශගතවීම මෙන්ම මව්පිය දෙදෙනාම රැකියාවට යාම වැනි කරුණු මත අනාරක්ෂිත වන ළමුන් හට රැකවරණය සැලසීම ආදිය වේ. මෙම මධ්‍යස්ථාන පහත සඳහන් ප්‍රදේශවල ස්ථාපිත කර ඇත.

- කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කිඹුල්වානාඔය ජනපදයෙහි
- අනුරාධපුර දිස්ත්‍රික්කයේ නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් විජයපුර ජනපදයෙහි
- පුත්තලම දිස්ත්‍රික්කයේ කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්බුද්ධි දියවර ගම්මානයෙහි
- අම්පාර දිස්ත්‍රික්කයේ කල්මුණේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්ඉස්ලාමාබාද් සුනාමි නිවාස සංකීර්ණයෙහි

මෙම මධ්‍යස්ථානවල සේවාලාභී ළමුන් මෙන්ම ඔවුන්ගේ දෙමාපියන් හා භාරකරුවන් සඳහා ළමා අපයෝජන පිටු දැකීම සහ ළමා ආරක්ෂණ ක්‍රමවේදයන් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් මෙන්ම ළමුන් සඳහා මනෝසමාජීය ක්‍රියාකාරකම්, පෞරුෂ සංවර්ධන වැඩසටහන්, සෞන්දර්යය හා රසාස්වාදය ඉහළනැංවීමේ ක්‍රියාකාරකම් සහ විභාගක්‍රියාකාරකම් පදනම් කරගත් වැඩසටහන් යනාදිය 2015 වර්ෂය තුළදී ක්‍රියාත්මක කර ඇත.









## ළමා කේන්ද්‍රීය මධ්‍යස්ථාන

ළමා ආරක්ෂාව වෙනුවෙන් ක්‍රියා කරනු ලබන රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකරණය කිරීම සහ ළමා උපදේශන සේවා ක්‍රියාත්මක කිරීම ළමා කේන්ද්‍රීය මධ්‍යස්ථාන තුළින් සිදුවේ. අධිකාරිය විසින් 2009 වසරේදී ප්‍රථම ළමා කේන්ද්‍රීය මධ්‍යස්ථානය වව්නියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේදී පිහිටුවමින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයන්හි ළමා කේන්ද්‍රීය මධ්‍යස්ථාන පිහිටුවීමේ වැඩපිළිවලක් ආරම්භ කරන ලදී.

මේ වන විට මුලතිව්, වව්නියාව, කිලිනොච්චිය, හම්බන්තොට හා මන්නාරම යන දිස්ත්‍රික්කයන්හි ළමා කේන්ද්‍රීය මධ්‍යස්ථාන පිහිටුවා ඇත.

## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

## 2015.12.31දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

( රුපියල් වලින් )

| විස්තරය | සටහන් | 2015 | 2014 ගලපන ලද ගිණුම් | 2014 |
|---|---|---|---|---|
| *ආදායම* | | | | |
| පුනරාවර්තන ප්‍රදාන -මහාභාණ්ඩාගාරය | | 235,370,000.00 | 152,072,000.00 | 152,072,000.00 |
| -අනෙකුත් ආයතන | 1 A | 10,785,633.18 | 40,299,670.42 | 40,299,670.42 |
| අනෙකුත් ආදායම් | 1 B | 1,404,514,.46 | 15,066,291.86 | 13,409,595.27 |
| ජාතික ක්‍රියාකාරිසැලැස්ම සඳහා භාණ්ඩාගාර ප්‍රදාන | | 47,000,000.00 | 29,000,000.00 | 29,000,000.00 |
| ජාතික ළමා ආරක්ෂක අරමුදල සඳහා ප්‍රදාන | 1 C | 578,958.69 | 5,657,665.21 | 5,657,665.21 |
| **මුළු ආදායම** | | **295,139,106.33** | **242,095,627.49** | **240,438,930.90** |
| ***වියදම්*** | | | | |
| පරිපාලන වියදම් | 2 | 215,628,638.10 | 140,911,234.74 | 138,089,588.65 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 3 | 56,510,468.86 | 56,204,041.80 | 50,950,283.51 |
| ව්‍යාපෘති වියදම් | 4 | 13,316,523.93 | 34,844,190.67 | 34,844,190.67 |
| ජාතික ළමා ආරක්ෂක අරමුදලේ වියදම් | 5 | 10,666,550.00 | 6,498,908.22 | 6,498,908.22 |
| මුල්‍ය වියදම් | 6 | 28,910.50 | 6,236.00 | 6,236.00 |
| **මුළු වියදම්** | | **296,151,091.39** | **238,464,611.43** | **230,389,207.05** |
| **ශුද්ධ අතිරික්තය / ඌනතාවය** | 7 | **(1,011,985.06)** | **3,631,016.06** | **10,049,723.85** |

## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

## 2015.12.31 දිනට මුල්‍යතත්ත්ව ප්‍රකාශය

( රුපියල් වලින් )

| විස්තරය | සටහන් | 2015 | 2014<br>ගලපන ලද ගිණුම් | 2014 |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| ***ජංගම නොවන වත්කම්*** | | | | |
| දේපල පිරියත හා උපකරණ | 8 | 94,509,420.04 | 94,354,036.18 | 94,354,036.18 |
| ආයෝජන හා ඉතිරිකිරීම් | 9 | 14,204,700.25 | 24,337,211.52 | 22,680,756.27 |
| දිගුකාලීන ලැබිය යුතු වත්කම් | 10 | 132,136.00 | 94,879.29 | 94,879.29 |
| | | **108,846,256.29** | **118,786,126.99** | **117,129,671.74** |
| ***ජංගම වත්කම්*** | | | | |
| භාණ්ඩ තොගය - ලිපි ද්‍රව්‍ය | | 613,759.21 | 331,720.50 | 331,720.50 |
| ආපදා ණය | | 470,734.14 | 470,734.14 | 470,734.14 |
| ලැබිය යුතු ගිණුම් | 11 | 41,122,861.18 | 33,853,830.16 | 37,422,273.91 |
| පෙර ගෙවීම් | 12 | 510,399.98 | 515,918.92 | 515,918.92 |
| මුදල් හා මුදල්වලට සමාන දෑ | 13 | 23,697,526.73 | 7,976,093.45 | 7,976,093.45 |
| | | **66,415,281.24** | **43,148,297.17** | **46,716,740.92** |
| **මුළු වත්කම්** | | **175,261,537.53** | **161,934,424.16** | **163,846,412.66** |
| **වගකීම්** | | | | |
| ***ජංගම නොවන වගකීම්*** | | | | |
| විශ්‍රාම පාරිතෝෂිකය | | 6,002,385.96 | 4,707,374.00 | 2,386,146.75 |
| සීමා සහිත අරමුදල් | 14 | 465,404.00 | 465,404.00 | 465,404.00 |
| ව්‍යාපෘති අතිරික්තය හෝ ඌනතාවය | 15-A | 14,647,830.15 | 17,033,298.10 | 17,033,298.10 |
| ජාතික ළමා ආරක්ෂක අරමුදල | 15-B | (10,559,826.63) | (697,085.32) | ( 697,085.32 ) |
| | | **10,555,793.48** | **21,508,990.78** | **19,187,763.53** |
| ***ජංගම වගකීම්*** | | | | |
| උපචිත ගිණුම් | 16 | 21,762,942.20 | 18,362,770.53 | 16,177,278.49 |
| කෙටිකාලීන ප්‍රතිපාදන | 17 | 1,137,611.14 | 1,049,969.14 | 1,049,969.14 |
| | | **22,900,553.34** | **19,412,739.67** | **17,227,247.63** |
| **මුළු වගකීම්** | | **33,456,346.82** | **40,921,730.45** | **36,415,011.16** |
| ***ශුද්ධ වත්කම්*** | | **141,805,190.71** | **121,012,693.71** | **127,431,401.50** |
| ***මූල්‍යනය වන්නේ*** | | | | |
| ප්‍රාග්ධන ප්‍රදානයන් | 18 | 150,542,976.54 | 141,356,976.54 | 141,356,976.54 |
| ප්‍රාග්ධන සංචිත | | 2,153,119.00 | 2,153,119.00 | 2,153,119.00 |
| ප්‍රත්‍යාගණන සංචිත | | 13,000,000.00 | 13,000,000.00 | 13,000,000.00 |
| රඳවාගත් ඉපැයුම් | | (23,890,904.83) | (35,497,401.83) | ( 29,078,694.04 ) |
| | | **141,805,190.71** | **121,012,693.71** | **127,431,401.50** |

## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
## 2015.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

( රුපියල් වලින් )

| විස්තරය | සටහන් | 2015 | 2014 ගලපන ලද ගිණුම් | 2014 |
|---|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වු අතිරික්තය / (ඌනතාවය) | | (1,011,985.06) | 3,631,016.06 | 10,049,723.85 |
| **මුදල් නොවන සංචලනයන්** | | | | |
| ක්ෂයවීම් | 8 | 10,141,621.62 | 8,934,820.88 | 8,934,820.88 |
| වාහන විකිණීමෙන් ලද ලාභ/(අලාභ) | | - | 345,550.00 | 345,550.00 |
| ගෙවිය යුතු ගිණුම්වල වැඩිවීම් | | 5,585,663.71 | 6,860,993.71 | 4,675,501.67 |
| කෙටිකාලීන වෙන්කිරීම් වැඩිවීම් | | 87,642.00 | 87,642.00 | 87,642.00 |
| තොග වැඩිවීම | | (282,038.71) | (146,730.13) | (146,730.13) |
| ලැබිය යුතු ගිණුම් වල වැඩිවීම් | | (3,700,587.27) | (10,917,089.36) | (14,485,533.11) |
| පූර්ව ගෙවුම් වැඩිවීම් | | 5,518.94 | 111,789.13 | 111,789.13 |
| ආපදා ණය වැඩිවීම් | | - | - | - |
| රඳවාගත් ඉපැයීම් වල වැඩිවීම්/ අඩුවීම් | | (6,048,434.99) | 360,446.53 | 360,446.53 |
| පාරිතෝෂිත දායකය | | 3,616,239.21 | - | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **8,393,639.45** | **9,268,438.82** | **9,933,210.82** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම් | | (10,297,005.48) | (13,313,025.20) | (13,313,025.20) |
| ස්ථාවර වත්කම් විකිණීම් | | - | 1,999,450.00 | 1,999,450.00 |
| දිගුකාලීන ලැබිය යුතු ගිණුම් වල වැඩිවීම් | | (37,256.71) | 144,910.59 | 144,910.59 |
| ප්‍රත්‍යාගණන සංචිත වැඩිවීම් | | - | - | - |
| ආයෝජන ප්‍රතිලාභ | | 8,476,056.02 | (103,684.47) | 1,552,770.78 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(1,858,206.17)** | **(11,272,349.08)** | **(9,615,893.83)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | | |
| පාරිතෝෂික වෙන් කිරීම් වල වැඩිවීම් | | - | 2,087,872.13 | (233,355.12) |
| සීමිත අරමුදල් වල වැඩිවීම් / අඩුවීම් | | - | (63,000.00) | (63,000.00) |
| ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් | | 9,186,000.00 | 7,100,550.00 | 7,100,550.00 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **9,186,000.00** | **9,125,422.13** | **6,804,194.88** |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ වල ශුද්ධ අඩුවීම් | | 15,721,433.28 | 7,121,511.87 | 7,121,511.87 |
| ආරම්භක මුදල් හා මුදල්වලට සමාන දෑ | | 7,976,093.45 | 854,581.58 | 854,581.58 |
| **වර්ෂය අග මුදල් සහ මුදල්වලට සමාන දෑ අවසන්** | 13 | **23,697,526.73** | **7,976,093.45** | **7,976,093.45** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } වීවීවයි/සී/එන්සීපීඒ/2015/01/05    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2017 මාර්තු 13 දින

සභාපතිනි,
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය.

**ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතේ 22(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) ඒ වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපතිනිය වෙත 2017 ජනවාරි 19 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය නිර්ණය කිරීම හා ක්‍රියාත්මක කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34   +94-11-2887223   oaggov@sltnet.lk   www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

---------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.74,943,183 ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08

2010 අගෝස්තු 25 දින සිට වැඩ තහනමට ලක් කළ අධිකාරියේ ගණකාධිකාරිණියට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වෙමින් පවතින නඩුවේ තීරණයට අනුව ඇය නැවත සේවයට පැමිණියහොත් ගෙවිය යුතු වැටුප්, පාරිතෝෂිත සහ වන්දි සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03**

(i) ප්‍රමිතයේ ඡේද අංක 12 ප්‍රකාරව රජයේ ප්‍රදාන යටතේ මිලදී ගනු ලබන වත්කම් ක්ෂය කිරීමට අනුරූපව රාජ්‍ය ප්‍රදාන ක්‍රමක්ෂය කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කර නොතිබූ බැවින්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට අධිකාරිය වෙත වත්කම් මිලදී ගැනීමට ලබා දී තිබූ රජයේ ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකම රු.මිලියන 150 ක් වුවද, එය නියෝජනය කල ශුද්ධ වත්කම් වල වටිනාකම රු. මිලියන 94.5 ක් විය.

(ii) ප්‍රමිතයේ ඡේද අංක 12 ප්‍රකාරව සේවක ණය ගෙවීම් ප්‍රතිපත්තිය පිළිබඳ මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

මූල්‍ය චලනයට බලපෑමක් නොවන ප්‍රදාන ලෙස මහා භාණ්ඩාගාරයෙන් ලද රු.5,795,000 ක් වටිනා මෝටර් රථයේ වටිනාකම වැරදි සහගත ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබූ රු. 1,068,554 ක් වටිනා ලී බඩු ජංගම නොවන වත්කම් ලෙස ගිණුම් ගත කර නොතිබීම නිසා රු. 160,283 ක් ක්ෂය අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ එකතුව රු.251,829 ක් වූ උපචිත වියදම් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර ඇති නිලධාරියෙකු වෙනුවෙන් 2014 හා 2015 වර්ෂවලදී අධිකාරිය විසින් ගෙවා තිබූ රු.542,945 ක වැටුප් අයවිය යුතුව තිබුණද එකී මුදල් ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම් ගතකර නොතිබුණි.

(ඉ) 2015 දෙසැම්බර් 31 දින වන විට ග්‍රාමීය සිවිල් සමාජ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට ලබාදුන් රු.7,292,500 ක අත්තිකාරම් මුදලින් සමාලෝචිත වර්ෂයට අදාල වූ වියදම රු. 6,413,119 වුවද රු.5,201,827 ක් පමණක් පියවීම් ලෙස ගිණුම්ගත කිරීමෙන් සමාලෝචිත වර්ෂයට අදාල වියදම් රු.1,211,292 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

### 2.2.3 නොසැසඳු පාලන ගිණුම්

ළමා ආරක්ෂක අධිකාරිය හා ළමා ආරක්ෂක අරමුදල අතර සිදුකරනු ලබන අන්තර් ගනුදෙනු සංකීර්ණ ලෙස ගිණුම්වල සටහන් කිරීම නිසා 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල අධිකාරියට අරමුදලින් ලැබිය යුතු ශේෂය රු. 5,889,373 ක් වැඩියෙන් ද, අධිකාරියෙන් අරමුදලට ගෙවිය යුතු ශේෂය රු. 3,236,982 ක් අඩුවෙන් ද දක්වා තිබුණි.

### 2.2.4 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

2012 නොවැම්බර් 29 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 131/02 මගින් සුනාමි වින්දිත දරුවන් වෙනුවෙන් ආරම්භ කර තිබූ ඉතිරි කිරීමේ ගිණුමක තිබූ රු. 15,000,000 ක් ස්ථාවර තැන්පත් ගිණුමක තැන්පත් කිරීමට හා එහි පොලිය ආධාර ගෙවීම සඳහා යොදා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන තිබුණි. එහෙත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව ඉහත ගිණුම අහෝසි කර එම මුදල් හා පොලී එකතුව වූ රු.19,138,794 ක් ඉතිරි කිරීමේ ගිණුමකට බැර කර තිබුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

මූල්‍ය ප්‍රකාශන අනුව ජංගම නොවන වගකීම් ලෙස දක්වා තිබූ එකතුව රු. 4,688,717 ක්වූ ව්‍යාපෘති ගිණුම් 6 ක ශේෂ නිරවුල් නොකර ඉදිරියට ගෙන එමින් පැවතුණි.

### 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය. | |
| (i) මුදල් රෙගුලාසි 104 | සමාලෝචිත වර්ෂය තුළදී සිදු වූ වාහන අනතුරු 3 ක් සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ පවත්වා ප්‍රාරම්භක වාර්තා, පූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |

| | |
|---|---|
| (ii) මුදල් රෙගුලාසි 135 | සමාලෝචිත වර්ෂයේ දී අධිකාරිය විසින් මුදල් ගෙවීම් හා මුදල් භාර ගැනීම් වලට අදාළව මූල්‍ය බලතල හා කාර්යය පැවරීමක් ලිඛිතව සිදුකර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 184 | රු.153,678 ක ලැබීම් සඳහා කුවිතාන්සි නිකුත් කර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 177(1) | එකතුව රු.11,030 ක මුදල් ලැබීම් සති 2 ක් හා මාස 7 ක් අතර කාල ප්‍රමාදයකින් පසුව බැංකු ගත කර තිබුණි. |
| (v) මුදල් රෙගුලාසි 264 | සෑම ගෙවීමකදීම මුදල් ලද බවට ආදායකයා ගෙන් තහවුරුවක් ලබා ගත යුතු වුවත්, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට සමාලෝචිත වර්ෂයේදී යැවූ රු.26,816,190 ක අත්තිකාරම් සඳහා එසේ තහවුරුවක් ලබා ගෙන නොතිබුණි. |
| (vi) මුදල් රෙගුලාසි 371 (2) (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු. 20,180,052 ක නිරවුල් නොකළ අත්තිකාරම් මුදල්වලින් රු. 9,503,682 ක් ඉකුත් වර්ෂවලට අදාළ විය. |
| (vii) මුදල් රෙගුලාසි 751 | මිලදී ගත් භාණ්ඩ සඳහා ගෙවීම් කිරීමේදී භාණ්ඩ ලැබීම් නියෝග ගෙවීම් වවුචර්වලට ඇමිණිය යුතු වුවද, වවුචර් 10 කින් මිලදීගත් එකතුව රු.3,427,008 ක භාණ්ඩ සඳහා එසේ කර නොතිබුණි. |
| (viii) මුදල් රෙගුලාසි 757 (2) | සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරිය සතුව පැවති රු.94,509,420 ක් වටිනා ස්ථාවර වත්කම්වල භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 2014 දෙසැම්බර් 26 දිනැති අංක පීආර්ඊ/2015/4සී දරන මැතිවරණ කොමසාරිස්ගේ ලිපිය | ඡන්ද විමසීම් කාල සීමාව තුළ පත්වීම් ලබා දීම් සිදු නොකළ යුතු වුවත් 2015 ජනවාරි 09 දින අධිකාරියේ සහකාර කළමනාකරු (නීති ක්‍රියාත්මක කිරීම) ලෙස නීති සහකාර iii ශ්‍රේණියේ නිලධාරිනියක් පත්කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු.1,011,985 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,631,016 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 4,643,001 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පරිපාලන වියදම් වැඩි වීම හා වෙනත් ආදායම් අඩු වීම මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී අධිකාරියේ 2011 සහ 2014 වර්ෂ වලදී පිළිවෙලින් රු. 6,826,677 ක හා රු. 3,631,016 ක අතිරික්තයන් ද 2012, 2013 හා 2015 වර්ෂ වලදී පිළිවෙලින් රු.12,058,337, රු.1;302,856 හා රු.1,011,985 ක් වශයෙන් ඌනතාවයන් ද නිරීක්ෂණය විය. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකීමේදී 2011 වර්ෂයේ රු. 45,237,873 ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂය වන විට රු. 219,958,470 ක් දක්වා ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කර තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ ශුද්ධ වත්කම්වල වටිනාකම රු. 141,805,191 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ ශුද්ධ වත්කම් වූ රු.121,012,694 හා සැසඳීමේදී රු. 20,792,497 ක හෙවත් සියයට 17 ක වැඩි වීමකි. සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු.43,514,727 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ කාරක ප්‍රාග්ධනය වූ රු.23,735,557 හා සැසඳීමේදී රු.19,779,170 ක හෙවත් සියයට 83 ක වැඩිවීමකි. මෙසේ කාරක ප්‍රාග්ධනය අසාමාන්‍ය ලෙස වැඩිවීමට නොපියවූ අත්තිකාරම් ශේෂයේ වැඩි වීම බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතේ සඳහන් පරිදි ළමා අපචාර වැළැක්වීම සහ එවැනි අපචාර වලට ගොදුරු වූ ළමයින් ආරක්ෂා කිරීම හා ඔවුන්ට ප්‍රතිකාර කිරීම පිණිස ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමත්, එය ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීතිමය හා පරිපාලන සංශෝධනයන් නිර්දේශ කිරීමත්, ළමා අපචාර වැලැක්වීමේ කාර්ය සඳහාත් එවැනි අපචාර වලට ගොදුරු වූවන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ අයිතීන් රැක ගැනීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීමත්, දැනුවත් කිරීමත්, නීති ක්‍රියාත්මක කිරීම් නියාමනය කිරීමත් විමර්ශන හා අපරාධ නඩු කටයුතු පිළිබඳ ප්‍රගතිය නියාමනය කිරීමත්, අධිකාරියේ ප්‍රධාන කර්තව්‍ය වේ.

මේ සම්බන්ධයෙන් සිදු කළ පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව "නිවාසගත දරුවන් හදිසි අනතුරු වලින් වලක්වා ගනිමු" යන මැයෙන් මනෝ සමාජීය මැදිහත් කරන හා ළමා නිවාස අධීක්ෂණ වැඩසටහන් පැවැත්වීම සඳහා ලේකම් කාර්යාල වෙත ළමා නිවාස 208 ක් සඳහා එකකට රු.9,700 බැගින් රු.2,017,600 ක් ගෙවා තිබූ අතර ඉන් රු.578,976 ක් වැය නොකර ආපසු එවා තිබුණි. රු.1,438,624 ක් වැය කරමින් පැවැත්වූ වැඩසටහන් හා අධීක්ෂණය කළ ළමා නිවාසවල තත්ත්වය පිළිබඳ වාර්තා ලබාගෙන ඒවායේ සඳහන් නිර්දේශයන් සම්බන්ධයෙන් කටයුතු කර අපේක්ෂිත අරමුණ ළඟා කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ළමා අපයෝජන හා කාන්තා හිංසනය වැළැක්වීම පිළිබඳ වැඩසටහන් පැවැත්වීම සඳහා අමාත්‍යාංශයෙන් ලබා දී තිබූ රු.මිලියන 12 න් අත්තිකාරම් ලෙස ලබාදී තිබූ රු.මිලියන 1.28 ක් පියවා නොතිබූ අතර, වැඩසටහන් පැවැත්වූ බවට සනාථ කර ගැනීම් සිදුකර නොතිබුණි.

(ඇ) සිවිල් සංවිධාන සාමාජිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් 197 ක් පැවැත්වීම සඳහා දිස්ත්‍රික්/ප්‍රාදේශීය නිලධාරින් 186 ක් වෙත රු. 4,432,500 ක අත්තිකාරම් ලබා දී තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට වැඩසටහන් පැවැත් වූ බවට අත්තිකාරම් පියවා තිබුණේ කාර්යාල 66 කින් පමණි. එය අපේක්ෂිත වැඩසටහන් ප්‍රමාණයෙන් සියයට 33 කි. වැඩසටහන් 18 ක් පැවැත්වීමට ප්‍රාදේශීය හා දිස්ත්‍රික් කාර්යාල 14 කට ලබා දුන් රු. 405,000 ක් අදාල කාර්යය සඳහා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඈ) ළමා ආරක්ෂක ගම්මාන දැනුවත් කිරීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 ක් වෙත රු. 10,000 බැගින් ලබා දුන් රු. 140,000 ක් වැඩසටහන් නොපැවැත්වීම නිසා ආපසු එවා තිබුණි.

(ඉ) 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අධිකාරිය වෙත ලැබී තිබූ පැමිණිලි 47164 න් නොවිසඳා සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉදිරියට ගෙන ගිය පැමිණිලි සංඛ්‍යාව 17604 ක් විය. අධිකාරිය වෙත වාර්ෂිකව ලැබෙන පැමිණිලි වලින් සීමිත ප්‍රමාණයක් පමණක් එම වර්ෂය තුළ විසඳීමත්, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් නිලධාරින් පැමිණිලි වලට සම්බන්ධ තොරතුරු රැස්කර වාර්තා කිරීම්, තොරතුරු කැඳවීම් හා විමර්ෂණ කටයුතු සිදු කිරීම් පිළිබඳ නිසි අධීක්ෂණයක් සිදු නොකිරීමත් නිසා නොවිසඳී ඇති පැමිණිලි සංඛ්‍යාව සීඝ්‍රයෙන් වර්ධනය වීමට හේතු වී තිබුණි.

4.2 **කළමනාකරණ ක්‍රියාකාරකම්**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පර්යේෂණ හා අධ්‍යයනයන් සිදුකිරීම සඳහා 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා රු.මිලියන 8.3 ක් වෙන්කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 3.43 ක් වැයකර ළමා අධ්‍යාපන ආරක්ෂාව සඳහා ඇති ආවරණයන් සහ පාසල්වල උපදේශන සේවා සැපයීමේ තත්ත්වය අධ්‍යයනය කිරීම සම්බන්ධයෙන් පර්යේෂණයක් පවත්වා තිබුණි. 2013 වර්ෂයේ සිදු කර තිබූ එම පර්යේෂණ වාර්තාවෙන් පොත් 500 ක් රු.194,556 ක් වැය කර සමාලෝචිත වර්ෂයේ දී මුද්‍රණය කර තිබූ අතර, මාස 06 කට පසු පොත් 370 ක් පමණක් ආයතන 06 ක් වෙත බෙදා දී තිබුණි. තවද එම වාර්තා වල සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට සුනාමි දරුවන් වෙත ලබාදීම සඳහා ලැබී තිබූ රු.555,524 ක් ප්‍රතිලාභී දරුවන්ට නොගෙවා රඳවා ගෙන තිබූ අතර මාසිකව රු.2,000 බැගින් ගෙවීම සඳහා ලැබුණු රු.144,000 කට අදාළ ප්‍රතිලාභී දරුවන් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.3** වාහන උපයෝජනය

-------------------------

අධිකාරියට මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු රු.7,550,000 ක් වටිනා බස් රථය 2014 සිට 2016 දක්වා දෙවසරක් තුළ කිලෝ මීටර 10989 ක් පමණක් ධාවනය කර තිබුණි. අධිකාරියේ අවශ්‍යතාවයන්ට උචිත නොවූ මෙම වාහනය ඌන උපයෝජිතව පැවතුණි.

**4.4** කාර්ය මණ්ඩල පරිපාලන

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 522 ක් සහ 405 ක් වීමෙන් තනතුරු 117 ක පුරප්පාඩු පැවැතුණු අතර ඉන් තනතුරු 105 ක් ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරීන් විය. කෙසේ වුවද මෙම තනතුරේ දැනට සේවයේ නියුක්තව සිටින නිලධාරීන් 255 ගෙන් සිදු කෙරෙන කාර්ය සාධනයන් පිළිබඳව නිසි අධීක්ෂණයන් සිදු නොවී පැවතුණි.

(ආ) අත්‍යවශ්‍ය ජ්‍යෙෂ්ඨ මට්ටමේ ප්‍රධාන තනතුරු 2 ක් වන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී හා සැලසුම් හා තොරතුරු කළමනාකාර යන තනතුරු පුරප්පාඩුව පැවතීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම් හා අධීක්ෂණයන් නිසි පරිදි සිදු නොවීමට හේතු වී තිබුණි.

(ඇ) අනුමත කාර්ය මණ්ඩලයෙහි වූ සහකාර කළමනාකරු (වැඩසටහන්) තනතුර සඳහා බඳවා ගත් නිලධාරිනියගේ පත්වීම් දිනය වූ 2007 ජූලි 01 දින සිට 2016 වර්ෂය දක්වා කාලය තුළදී වසර 5 කට වැඩි කාලයක් වෙනත් ආයතන වෙත සේවය සඳහා මුදා හැර තිබීමෙන් සහකාර කළමනාකරු (වැඩසටහන්) තනතුරෙහි සේවය අධිකාරිය වෙත ලබාගෙන නොතිබුණි.

(ඉ) බඳවාගැනීමේ පටිපාටියට අනුව වැඩසටහන් කළමනාකාර තනතුර සඳහා පත් කිරීමට කළමනාකරණ මට්ටමේ මධ්‍යම 1 පන්තියේ වසර 5 ක පළපුරුද්ද හෝ උපාධිය හා පශ්චාත් උපාධිය සමඟ වසර 12 ක් කළමනාකාර මට්ටමේ පළපුරුද්දක් තිබිය යුතු වුවද අධිකාරිය විසින් වසර 12ක කළමණාකාර මට්ටමේ සුදුසුකම් නොමැති සහකාර දිස්ත්‍රික් සමායෝජක තනතුරේ නිලධාරිනියක් එම තනතුරට පත්කර තිබුණි.

(ඊ) නියැදි පරීක්ෂාවට අනුව පෞද්ගලික ලිපිගොනු දීර්ඝ කාලයක සිට ක්‍රමවත්ව නඩත්තු නොකිරීමේ අඩුපාඩු අතර, රැකියාව සඳහා අයදුම් පත්‍රයක් ඉදිරිපත් නොකළ අවස්ථාවක් සහ බඳවා ගැනීමෙන් පසු වෛද්‍ය පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම මාස 06 සිට අවුරුදු 04 දක්වා ප්‍රමාද කළ අවස්ථා 3 ක් ද, අධ්‍යාපන සහතික ප්‍රමාදවී සනාථ කර ගෙන තිබූ අවස්ථා 02 ක්ද, එම සහතික සනාථ කර නොගත් අවස්ථාවක්ද අධිකාරියෙන් ඉවත්වූ නිලධාරියෙක් ඔහු භාරයේ පැවති භාණ්ඩ හෝ ලබාගත් අත්තිකාරම් මුදල් හා ලිපිගොනු භාරදීම් සිදු නොකළ අවස්ථාවක් විය.

(උ) කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමෙන් තොරව වැටුප් වර්ධක ගෙවීම් හා සේවය ස්ථිර කිරීම සිදුකර තිබුණි.

4.5 දූශ්‍ය අක්‍රමිකතා

--------------------

අත්තිකාරම් ලෙස ලබා ගත් රු.31,500 ක් හා රු.20,300 ක් පියවීම සඳහා ඉදිරිපත් කර තිබූ බිල්පත් වල ඉලක්කම් වෙනස් කර රු. 9,000 ක් වැඩිපුර ලබාගෙන තිබුණි.

4.6 අරමුදල් ඌන උපයෝජනය

---------------------------------

ලංකා බැංකුවේ පවත්වාගෙන යනු ලබන එකතුව රු. 159,397 ක් වූ ජංගම ගිණුම් දෙකක ශේෂයන් වසර 4 කට අධික කාලයක සිට නිශ්කාර්යව පැවතුණි.

4.7 ආර්ථික නොවූ ගනුදෙනු

--------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 සංවර්ධන ක්‍රියාකාරි සැලැස්ම අනුව දින සැමරුම් සඳහා රු. මිලියන 2.96 ක් වෙන් කර තිබූ නමුත් ඒ සඳහා රු. මිලියන 3.94 ක් වැය කර තිබුණි. මෙම මුදලින් ඵලදායී කාර්යයකට යෙදවිය හැකිව තිබූ රු. මිලියන 1.44 ක් පුවත්පත් දැන්වීම් සඳහා වැය කර තිබුණි.

(ආ) රේඛීය අමාත්‍යාංශයේ හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ශ්‍රවණාගාර භාවිතා කළ හැකිව තිබිය දී රු. 336,446 ක් වැය කරමින් ලෝක ළමා දින සැමරීම සඳහා ළමා ආරක්ෂාව පිළිබඳ සමුළුවක් 2015 ඔක්තෝබර් 08 දින පුද්ගලයින් 52 දෙනෙකුගේ

සහභාගිත්වයෙන් කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ "මිහිලක මැදුරේ" පවත්වා තිබූ අතර, ශාලා ගාස්තු වශයෙන් රු. 108,346 ක් ගෙවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහ පාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති හා අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව අධිකාරිය විසින් ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 සැප්තැම්බර් 01 දින එනම් මාස 06ක කාල ප්‍රමාදයකින් පසුව විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

### 5.2 සංයුක්ත සැලැස්ම

අධිකාරියේ කාර්යභාරය සම්බන්ධව වර්ෂ 2012-2017 දක්වා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද 2003 ජුනි 02 දිනැති හා අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව සංයුක්ත සැලැස්මේ ඇතුළත් වන පරිදි එක් එක් වැඩසටහනේ අරමුණු ළගාකර ගැනීමේ ඉලක්ක හා නිශ්චිත කාල වකවානු හඳුනාගෙන නොතිබූ බැවින් එය ක්‍රියාකාරී සැලැස්ම සමඟ සම්බන්ධ කර අරමුණු ළඟාකර ගැනීම සඳහා ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයක පැවතුණි.

### 5.3 අභ්‍යන්තර විගණනය

2009 ජුනි 09 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක ඩීඑම්ජ්/2009(1) හි 7 ඡේදයට අනුව තම වාර්ෂික විගණන වැඩසටහන පිළියෙළ කිරීමේදී අනුමත වාර්ෂික ඇස්තමේන්තුව ක්‍රියාකාරි සැලැස්ම, නව අයවැය යෝජනා, විදේශ ආධාර ව්‍යාපෘති යනාදි ආයතනයේ සියළුම අංශයන් පිළිබඳව සලකාබලා සියලු අංශයන් වල කටයුතු ආවරණය වන ලෙස සෑම වර්ෂයකම ජනවාරි 31 දිනට පෙර තම විගණන වැඩසටහන පිළියෙළ කළයුතු අතර එහි පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.එසේ වුවද ළමාරක්ෂක අධිකාරියේ 2014 ජුලි මාසයේ සිට 2015 ඔක්තෝබර් 15 දින දක්වා අභ්‍යන්තර විගණකවරයකු අනුයුක්ත නොකිරීම හේතුවෙන් අභ්‍යන්තර විගණනයක් සිදුවී නොතිබුණු අතර රේඛීය අමාත්‍යාංශයෙන්ද අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.

## 5.4 විගණන කමිටු

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන යහපාලනය පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛයේ 7.4.1 වගන්තිය අනුව අවම වශයෙන් මාස 03කට වරක් විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතු වුවත්, 2015 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු 02 ක් පමණක් පවත්වා තිබුණි.

## 5.5 ප්‍රසම්පාදන සැලැස්ම

2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ඡේදය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධිකාරියේ සභාපතිනියගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | උපචිත වියදම් ගැලපීම්, ක්ෂය වෙන් කිරීම්, ජර්නල් සටහන් යෙදීම නිසි පරිදි සිදු කර නොතිබීම. |
| (ආ) අත්තිකාරම් පාලනය | අත්තිකාරම් ලබාදීම හා නිරවුල් කිරීම නිසි පාලනයකින් සිදු කර නොතිබීම. |
| (ඇ) මෙහෙයුම් පාලනය | පැමිණිලි සඳහා විසඳුම් ලබා දීමේ ප්‍රමාදයන් හා පැවැත් වූ වැඩසටහන් පිළිබඳ ප්‍රගතීන්,පසුවිපරම් කටයුතු හා අධීක්ෂණයන් සිදුකර නොතිබීම. |
| (ඉ) සැලසුම් ක්‍රියාත්මක කිරීම | වැඩසටහන් නිසි පරිදි සැලසුම් නොකිරීම හා ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් සිදුවීම. |



එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති